## දෙවැනි කොටස

## මහ බැංකුවේ ගිණුම් හා කටයුතු


| | පිටුව |
|---|---|
| ගිණුම් .... .... .... .... .... | I |
| විදේශ විනිමය .... .... .... .... .... | I |
| දේශීය බැංකු කටයුතු .... .... .... .... .... | IV |
| ව්‍යවහාර මුදල් නිකුතුව .... .... .... .... .... | V |
| බැංකු කටයුතු සංවර්ධන .... .... .... .... .... | VI |
| බැංකු පරිපාලන .... .... .... .... .... | VII |
| සංවර්ධන මුදල් .... .... .... .... .... | VII |
| ග්‍රාමීය ණය .... .... .... .... .... | XII |
| ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය .... .... .... | XVI |
| ආර්ථික පර්යේෂණ .... .... .... .... .... | XVI |
| සංඛ්‍යාන .... .... .... .... .... | XVII |
| රාජ්‍ය ණය .... .... .... .... .... | XVIII |
| විනිමය පාලනය .... .... .... .... .... | XXIII |
| සේවක අර්ථසාධක අරමුදල .... .... .... .... | XXIV |
| ආයතන කටයුතු .... .... .... .... .... | XXVIII |
| දත්ත සැකසුම් .... .... .... .... .... | XXVIII |
| පරිශ්‍ර .... .... .... .... .... | XXIX |
| ප්‍රවෘත්ති .... .... .... .... .... | XXIX |
| ලේකම් දෙපාර්තමේන්තුව .... .... .... .... | XXX |
| කළමණාකාරිත්ව විගණන .... .... .... .... | XXX |
| මාතර ප්‍රාදේශීය කාර්යාලය .... .... .... .... | XXX |
| කාර්ය මණ්ඩල පුවත් .... .... .... .... | XXXIII |

# මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

## ගිණුම්

1981 දෙසැම්බර් මස 31 වැනි දිනට මහ බැංකුවේ ශේෂ පත්‍රය හා 1981 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභාලාභ ගිණුම 2.1 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

1980 දෙසැම්බර් 31 වැනි දිනට පැවති රු. 2283,16,53,904 සමහ සසඳන විට 1981 දෙසැම්බර් 31 වැනි දිනට මහ බැංකුවේ මුළු වත්කම් ප්‍රමාණය රු. 2735,18,05,694 ක්ව පැවතියේය. රු. 452,01,51,790 ක් වූ මෙම වැඩි වීමට හේතු වූයේ ''ජාත්‍යන්තර සංචිතය'' සහ ''දේශීය වත්කම්'' යන දෙකෙහිම වැඩිවීමයි. 1980 දෙසැම්බර් මස 31 වැනි දින රු. 440,42,86,904 ක්ව පැවතුන ''ජාත්‍යන්තර සංචිතය'' 1981 දෙසැම්බර් 31 වැනි දින වන විට රු. 666,67,56,907 ක් වී රු. 226,24,70,003 ක වැඩි වීමක් වාර්තා කළ අතර, 1980 දෙසැම්බර් මස 31 වැනි දිනට රු. 1219,94,46,333 ක්ව පැවතුන ''දේශීය වත්කම්'' 1981 දෙසැම්බර් මස 31 වැනි දින වන විට රු. 1562,27,33,001 ක් වී රු. 342,32,86,668 ක වැඩි වීමක් පෙන්නුම් කරන ලදී. 1980 දෙසැම්බර් මස 31 වැනි දිනට රු. 622,79,20,667 ක්ව පැවතුන ''වෙනත් වත්කම් හා ගිණුම්'' වල එකතුවද 1981 දෙසැම්බර් මස 31 වැනි දිනට රු. 506,23,15,786 ක් වී රු. 116,56,04,881 ක අඩු වීමක් වාර්තා කරන ලදී.

සමාලෝචිත කාලසීමාව තුළදී බැංකුවේ වගකීම්වල ඇති වූ වැඩි වීමට බොහෝ සෙයින් හේතු වූයේ තැන්පතු වගකීම් රු. 534,25,35,514 සිට රු. 897,05,88,690 දක්වා රු. 362,80,53,176 කින් වැඩි වීමයි. ව්‍යවහාර මුදල් සංසරණය රු. 500,95,16,039 සිට රු. 564,34,97,160 දක්වා රු. 63,39,81,121 කින් වැඩි වූ අතර, ''වෙනත් වගකීම්'' රු. 1133,60,40,572 සිට රු. 1175,48,45,244 දක්වා රු. 41,88,04,672 කින් වැඩි විය.

රු. 219,35,79,293 ක් වූ 1981 වර්ෂය සඳහා වන බැංකුවේ ආදයම රු. 260,20,98,160 ක් වූ පෙර වර්ෂයේ ආදයම හා සසඳන විට රු. 40,85,18,867 ක අඩු වීමක් පෙන්නුම් කළේය. වියදම, සංචිත ගිණුම් සඳහා වෙන් කැරුම් හා අගයක්ෂය සඳහා ප්‍රතිපාදන රු. 216,97,83,959 ක් විය. මූල්‍ය ගැලපීම් ගිණුමට හර වශයෙන් වූ රු. 2,27,95,334 ක ශේෂය, මුදල් නීති පනතේ 39(අ) වගන්තිය අනුව බැංකුවේ ආදයමින් පියවමින් ඇවර කරන්නට යෙදින. බැංකුවේ ශුද්ධ ලාභය වූ රුපියල් දශ ලක්ෂයක මුදල අතිරික්තයට එක් කරන ලදී.

## විදේශ විනිමය

බැංකුව සෑම වැඩ කරන දිනයකම විදුලි සංදේශ පැවරුම් සඳහා ව්‍යවහාර මුදල් වර්ග සයක් එනම්, එක්සත් ජනපද ඩොලර්, රන් පවුම්, ඩොයිෂ් මාක්, ප්‍රංශ ප්‍රැන්ක්, ජපන් යෙන් හා ඉන්දියානු රුපියල් වෙනුවෙන් නිළ විනිමය අනුපාතික නියම කිරීම තවදුරටත් කරගෙන ගියේය. 1981 අවසන් වන විට පැවති, මෙම ව්‍යවහාර මුදල් සඳහා වූ විනිමය අනුපාතික 2.2 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. බැංකුව විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු පිළිබඳ කටයුතු තවදුරටත් වෙළෙඳ බැංකු සමහ පවත්වාගෙන ගියේය.

### ආසියානු නිශ්කාෂණ සංගමය

ආසියානු නිශ්කාෂණ සංගමය මාර්ගයෙන් කැරුන මහ බැංකු ගණුදෙනුවල වටිනාකමෙහි මුළු එකතුව පෙර වර්ෂයෙහිවූ රුපියල් දශ ලක්ෂ 3,187.7 සමග සසඳන විට සමාලෝචිත වර්ෂය තුළ රුපියල් දශ ලක්ෂ 4,356.2 ක් විය. 1975 වර්ෂයේදී ආසියානු නිශ්කාෂණ සංගමය ආරම්භ කිරීමෙන් පසුව, දෙමසකට වරක් සිදු කරනු ලබන ශේෂයන් බේරුම් කිරීම් සියල්ලම ශ්‍රී ලංකාවේ වාසියට කෙළවර වූයේ 1981 වර්ෂයේදී පමණි. සමාලෝචිත වර්ෂය තුළ ශුද්ධ ලැබීම් රුපියල් දශ ලක්ෂ 740.2 ක් වූ අතර, 1980 වර්ෂය තුළ ශුද්ධ ගෙවීම් රුපියල් දශ ලක්ෂ 675.1 ක් විය.

# මුදල් හා බැංකු ගණුදෙනු

**1981 දෙසැම්බර් මස 31 වැනි දිනට**

**1981 දෙසැම්බර් මස 31 වැනි**

## වගකීම්

| 1980 දෙසැම්බර් මස 31 දින රුපියල් | | | 1981 දෙසැම්බර් මස 31 දින රුපියල් | |
|---|---|---|---|---|
| | | **ප්‍රාග්ධන ගිණුම** | | |
| 1,50,00,000 | | ප්‍රාග්ධනය .. | 1,50,00,000 | |
| 6,50,00,000 | 8,00,00,000 | අතිරික්තය .. | 6,60,00,000 | 8,10,00,000 |
| | | **සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල්** | | |
| 480,76,02,981 | | නෝට්ටු .. | 541,24,25,674 | |
| 20,19,13,058 | 500,95,16,039 | කාසි .. | 23,10,71,486 | 564,34,97,160 |
| | | **තැන්පතු** | | |
| 134,58,00,620 | | රජය .. | 144,07,37,041 | |
| 1,32,11,080 | | රාජ්‍ය නියෝජ්‍යත්ව හා ආයතන .. | 1,55,40,643 | |
| 126,36,74,391 | | වෙළෙඳ බැංකු .. | 184,63,42,353 | |
| 237,39,49,480 | | ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන .. | 535,06,91,097 | |
| | | භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ රු.12,05,46,500 හැර | | |
| 85,458 | | අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදල .. | 3,06,073 | |
| 34,58,14,485 | 534,25,35,514 | අනෙකුත් .. | 31,69,71,483 | 897,05,88,690 |
| | 42,85,61,779 | විදේශීය ණය ගැනීම් .. | | 26,68,74,600 |
| | 52,50,00,000 | මධ්‍යම හා දීර්ඝකාලීන ණය අරමුදල .. | | 52,50,00,000 |
| | 11,00,00,000 | ප්‍රාග්ධන දයක දීමනා ගිණුම .. | | 11,00,00,000 |
| | 1133,60,40,572 | අනෙකුත් වගකීම් හා ගිණුම් .. | | 1175,48,45,244 |
| | 2283,16,53,904 | | | 2735,18,05,694 |

**1981 දෙසැම්බර් මස 31 වැනිදයින්**

| රුපියල් | | රුපියල් |
|---|---|---|
| 260,10,98,160 | සාමාන්‍ය වියදම් (වැටුප්, මුදල් නෝට්ටු හා කාසි සඳහා වියදම් හා බැංකු ගොඩනැගිලි හා කාර්යාල උපකරණ සඳහා ක්ෂයවීම ඇතුළුව) සහ මුදල් නීති පනතේ 38 වැනි වගන්තිය ප්‍රකාර ඉන්පසුව කරන ලද වෙන් කිරීම .. | 216,97,83,959 |
| | 1981 දෙසැම්බර් 31 වැනිදයින් අවසන්වූ වර්ෂයේ ශුද්ධ ලාභය | |
| | මූල්‍ය ගැලපීම් ගිණුමට – මුදල් නීති පණතේ 39 (අ) වගන්තිය ප්‍රකාර ශේෂය පියවීමට රු. 2,27,95,334 | |
| 10,00,000 | මුදල් නීති පනතේ 39 (ආ) වගන්තිය ප්‍රකාර අතිරික්තයන් වශයෙන් යොදා ගන්නා ලදී. රු. 10,00,000 | 2,37,95,334 |
| 260,20,98,160 | | 219,35,79,293 |

**ඩබ්ලිව්. රාසපුත්‍රම්**
**අධිපති.**

**එච්. ප්‍රේමරත්න**
**ප්‍රධාන ගණකාධිකාරී.**

# ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්
# දිනට ශේෂ පත්‍රය

## වත්කම්

| 1980 දෙසැම්බර් මස 31 දින රුපියල් | | | 1981 දෙසැම්බර් මස 31 දින රුපියල් | |
|---|---|---|---|---|
| | | **ජාත්‍යන්තර සංචිතය** | | |
| 393,74,19,823 | | පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂයන් .. | 559,11,08,534 | |
| 46,68,67,081 | | *විදේශීය සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් .. | 63,86,48,498 | |
| — | 440,42,85,904 | විශේෂ ගැනීම් හිමිකම් පත් .. | 43,69,99,875 | 666,67,56,907 |
| | | **දේශීය වත්කම්** | | |
| | | ණය සහ අත්තිකාරම් | | |
| 162,76,37,810 | | රජයට .. | 153,64,37,811 | |
| | | අනෙකුත් අයට– මධ්‍යම හා | | |
| 21,01,31,641 | | දීර්ඝකාලීන .. | 41,13,62,446 | |
| 91,37,69,800 | | කෙටිකාලීන .. | 99,69,21,098 | |
| 933,79,07,082 | | රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් .. | 1,256,80,11,646 | |
| 11,00,00,000 | 1,219,94,46,333 | මූල්‍ය හා අනෙකුත් ආයතනවලට දයක දීමනා .. | 11,00,00,000 | 1562,27,33,001 |
| | 622,79,20,667 | අනෙකුත් වත්කම් හා ගිණුම් .. | | 506,23,15,786 |
| | 2,283,16,53,904 | | | 2735,18,05,694 |

*1964 පෙබරවාරි මස 01 වැනි දින රු. 54,41,169 ප්‍රකාශිත වටිනාකමට හා 1965 මැයි මස 24 වැනි දින රු. 57,450 ප්‍රකාශිත වටිනාකමට රජයේ ආයතන වලින් ලබාගත් සුරැකුම්පත් ඇතුළත් වෙයි. (ඒ දිනවල මෙකී සුරැකුම්පත්වල ඇස්තමේන්තු කළ වෙළෙඳ වටිනාකම පිළිවෙලින් රු. 28,67,960 ක් සහ රු. 34,340 ක් විය.)

## අවසන් වූ වර්ෂයේ ලාභාලාභ ගිණුම

| 1980 දෙසැම්බර් මස 31 දින රුපියල් | | | 1981 දෙසැම්බර් මස 31 දින රුපියල් | |
|---|---|---|---|---|
| | 260,20,98,160 | පොළී ආදිය .. | | 219,35,79,293 |
| | 260,20,98,160 | | | 219,35,79,293 |

1981 දෙසැම්බර් මස 31 වැනි දිනට අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය සමග කියවන ලද 1971 අංක 38 දරණ මුදල් නීති පනතේ 13(1) වගන්තිය සහ මුදල් නීති පනතේ (පරි. 422) 42 (1) වගන්තිය අනුව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මුදල් නීති පනතේ (පරි. 422) 42 (2) වගන්තිය ප්‍රකාර මුදල් ඇමතිතුමා වෙත ඉදිරිපත් කළ යුතු මාගේ වාර්තාව යථාකාලයේ දී ඉදිරිපත් කෙරේ.

පී. එම්. ඩබ්ලිව්. විජයසූරිය
විගණකාධිපති.

1982 අප්‍රේල් 9 වැනි දින,
කොළඹ 7,
විගණක කාර්යාලයේදීය.

## 2·2 සංඛ්‍යා සටහන
## විනිමය අනුපාතික

ශ්‍රී ලංකා රුපියල්

| ව්‍යවහාර මුදල් ඒකක 100 කට | 1981 වර්ෂය අවසානයේමැදි අනුපාතිකය |
|---|---|
| එක්සත් ජනපද ඩොලර් .. .. .. | 2,055·00 |
| රන් පවුම් .. .. .. | 3,890·10 |
| ඩොයිෂ් මාර්ක් .. .. .. | 904·30 |
| ප්‍රංශ ප්‍රැන්ක් .. .. .. | 357·40 |
| ජපන් යෙන් .. .. .. | 9·2605 |
| ඉන්දියානු රුපියල් .. .. .. | 220·63 |

**පෙරළා සියරට යන ඉන්දියානුවන් වෙත ආධාරක හා කරුණා සහගත ගෙවීම්**

1964 ඉන්දු – ලංකා ගිවිසුම මගින් ආවරණය කැරුණු ඉන්දියානු සම්භවය ඇති වතු කම්කරුවන් පෙරළා සියරට යැම ඉක්මන් කරවනු පිණිස, රජය වෙනුවෙන් ක්‍රම දෙකක් ක්‍රියාත්මක කරවීම බැංකුව විසින් තවදුරටත් කරගෙන යන ලදී. මේවා නම්, (1) පෙරළා සියරට යන්නන් හට ප්‍රේෂණය කිරීමට බලය දෙන ලද ප්‍රමාණයෙන් සියයට 65 ට සමාන මුදලක් හෝ ඉන් කොටසක් ආධාර වශයෙන් ගෙවීම, හා (2) මෙම කම්කරුවන්ට දිවයින හැර යාම සඳහා දිරි ගැන්වීමක් වශයෙන් කරුණා සහගත ගෙවීමක් ලෙස රු. 500 ක් හා එම මුදලින් සියයට 65 ක්, ගෙවීමය. බැංකුව මෙම ක්‍රම දෙක වෙළෙඳ බැංකු මගින් ක්‍රියාත්මක කළේය.

## දේශීය බැංකු කටයුතු

රජයේ හා රජය සහතික කළ සුරැකුම්පත් හා වාණිජ හා නිෂ්පාදන ණයට අදාළ භාවිතීය පොරොන්දු නෝට්ටු මත වෙළෙඳ බැංකුවලට දෙනු ලබන කෙටිකාලීන අත්තිකාරම් සඳහා වන මහ බැංකු පොළී අනුපාතිකය (බැංකු අනුපාතිකය) 1981 අගෝස්තු 17 වැනි දින සියයට 12 සිට සියයට 14 දක්වා වැඩි කරන ලදී. එසේ වුවද, ශ්‍රී ලංකාවේ අපනයන මූල්‍යකරණය පිණිස බැංකුවලට සහාය වීම සඳහා මහ බැංකුව විසින් වෙළෙඳ බැංකු වෙත දෙනු ලබන කෙටිකාලීන ප්‍රතිමූල්‍ය ණය සඳහා වන පොළී අනුපාතිකය තවදුරටත් වර්ෂයකට සියයට 12 වශයෙන් පවත්වා ගෙන යන ලදී.

මහ බැංකුව විසින් බැංකු අනුපාතිකයට අනුව වෙළෙඳ බැංකු වෙත ලබා දෙනු ලබන ප්‍රතියෝජන සියළුම බැංකුවලට බලපාන පරිදි පොදු සීමාවකට යටත් කරන ලදී. එක් බැංකුවක් වෙනුවෙන් රුපියල් දශ ලක්ෂයක අවම වෙන් කිරීමකට යටත්ව, වෙළෙඳ බැංකු සතුව පැවතුන තෝරා ගත් වත්කම් වර්ග පදනම් කරගෙන එක් එක් බැංකුව වෙනුවෙන් මෙම වෙන් කිරීම සිදු කරන ලදී. 1976 ජූනි මස 30 වැනි දිනට අත්‍යවශ්‍ය නොවන කාර්යයන් සඳහා දෙන ලද අත්තිකාරම් ප්‍රමාණය නොඉක්මවන්නේ නම් සෑම බැංකුවකටම එකී බැංකුව වෙනුවෙන් වෙන් කර ඇති සීමාව දක්වා ණය ලබා ගැනීමට අවසර දෙන ලදී. අත්‍යවශ්‍යනොවන කාර්යයන් සඳහා දී ඇති අත්තිකාරම් ප්‍රමාණය 1976 ජූනි මස 30 වැනි දිනට එවැනි කාර්යයන් සඳහා දී ඇති අත්තිකාරම් ප්‍රමාණය ඉක්මවන්නේ නම් එසේ ඉක්මවන ලද ප්‍රමාණය වෙන් කරන ලද සීමාවෙන් අඩු කරනු ඇත. ශ්‍රී ලංකාවෙන් කැරෙන අපනයනයන් ප්‍රතිමූල්‍යකරණය සඳහා වෙළෙඳ බැංකු විසින් ගනු ලබන ණය මතද සීමාවන් පනවන ලදී. ක්‍රමයෙන් වැඩි වන පරිමාවකට අනුව සැකසුන දණ්ඩන පොළී අනුපාතිකයන් මත බැංකු අනුපාතිකයට අනුව මහ බැංකුව විසින් ණය දීමේ සීමාවන් ඉක්මවා වුවද වෙළෙඳ බැංකු වෙත ණය ලබා දෙන ලදී. 1981 අගෝස්තු මස 17 වැනි දින සිට ක්‍රියාත්මක වුන මෙකී දණ්ඩන පොළී අනුපාතිකයන් නියමිත සීමාවන් ඉක්මවා එක් එක් බැංකුව මගින් ලබා ගන්නා ලද ණය මට්ටම අනුව වර්ෂයකට සියයට 21 හා වර්ෂයකට සියයට 30 අතර වූ ප්‍රමාණයන්ගෙන් වෙනස් විය.

වී, එළවළු හා වෙනත් නියමිත භෝග වර්ග නිෂ්පාදනයට සම්බන්ධ සමුපකාර සමිතිවල හෝ පුද්ගලයන්ගේ භාවිතීය පොරොන්දු නෝට්ටු මත වෙළෙඳ බැංකුවලට දෙන ලද මහ බැංකු අත්තිකාරම් සඳහාවූ පොළී අනුපාතිකය තවදුරටත් වර්ෂයකට සියයට 1.5 ක්ව පැවතියේය. වෙළෙඳ බැංකු විසින් සමුපකාර සමිති, කෘෂිකාර්මික සේවා මධ්‍යස්ථාන හා බලය ලත් පුද්ගලයනට සහතික මිළ ක්‍රමය යටතේ වී මිළදී ගැනීම හා මෙරට වැවෙන වෙනත් සමහර නියමිත භෝග වර්ග මිළදී ගැනීම, ගබඩා කිරීම හෝ විකිණීම සඳහා මුදල් යෙදවීම පිණිස භාවිතීය නෝට්ටු මත මහ බැංකුව විසින් වෙළෙඳ බැංකුවලට දෙන අත්තිකාරම් සඳහා පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 3 ක මට්ටමෙහි නොවෙනස්ව පැවතියේ ය.

**රජයේ ගිණුම්**

රාජ්‍ය ගිණුම් ශාඛාව, රජයේ බැංකුකරු වශයෙන් තවදුරටත් රජයේ දෙපාර්තමේන්තු හා සමහර ව්‍යවස්ථාපිත මණ්ඩලවල ගිණුම් පවත්වාගෙන ආයේය.

1981 වර්ෂය අවසානයේදී රාජ්‍ය ගිණුම් ශාඛාවෙහි ක්‍රියාත්මක ගිණුම් සංඛ්‍යාව 148 ක් (රජයේ දෙපාර්තමේන්තු 134 සහ ව්‍යවස්ථාපිත මණ්ඩල 14) විය.

1981 මාර්තු 18 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය ගිණුම් ශාඛාවෙහි ගිණුම් තැබීමේ ක්‍රමය පරිගණක යන්ත්‍රානුසාරයෙන් කරන ලද අතර, එමගින් ගිණුම් හිමියනට වඩා හොඳ සේවයක් ලබා දෙන ලදී.

එතෙක් කුවුන් ඒජන්තවරුන් විසින් කරන ලද විදේශ චෙක්පත් හා අණකර වෙනුවෙන් අය රැස් කිරීමේ හා ලත් මුදල් බැර කිරීමේ සේවාවන් තැපැල්පතිගේ ඉල්ලීම පිට රාජ්‍ය ගිණුම් ශාඛාව විසින් බාර ගන්නා ලදී.

**භාණ්ඩාගාර බිල්පත්**

1981 අප්‍රේල් මස 21 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුව භාණ්ඩාගාර බිල්පත් පිළිබඳ විවට වෙළෙඳ කටයුතු අරඹන ලදී. මෙම ක්‍රමය යටතේ බැංකුව තම සුරැකුම්පත් විකුණා විවිධ කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත් මිලට ගනී. එක් එක් වැඩ කරන දිනයෙහි පැවැති වට්ටම් අනුපාතිකය, මූල්‍ය වෙළෙඳපොලෙහි ද්‍රවශීලතාවය සහ පොළී අනුපාතිකයනට අනුව වෙනස් විය. 1981 අප්‍රේල් මස 21 වැනි දින සිට 1981 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලච්ඡේදය තුළදී මෙම ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 9,149.3 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් විකුණන ලදී. එම කාලය තුළදී රුපියල් දශ ලක්ෂ 4,653.5 ක ප්‍රති මිලට ගැනීම් සිදු කැරිණි. 1981 දෙසැම්බර් මස 31 වැනි දිනට විකුණනු ලැබ කල් නොපිරී තිබුණු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 709.4 ක් විය. වර්ෂය තුළ භාණ්ඩාගාර බිල්පත්වල විවට වෙළෙඳ කටයුතු වලට අදාළ වට්ටම් අනුපාතිකයන් වර්ෂයකට සියයට 13.5 හා 17 ත් අතර පැවතිණි. භාණ්ඩාගාර බිල්පත් සඳහා කාර්යශීලී වෙළෙඳපොළක් ගොඩ නැංවීමේ අටියෙන් ද්විතීය වෙළෙඳපොලෙහි බැංකුවේ විකුණුම් කටයුතු මුළුමනින්ම කොළඹ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන මුදල් සහ විනිමය බ්‍රෝකර් වරුන් මගින්ම සිදුකරන ලදී. එසේ වුවද, භාණ්ඩාගාර බිල්පත් හිමිකරුවකුට බ්‍රෝකර් කෙනෙකුගේ මැදිහත් වීමකින් තොරව සිය භාණ්ඩාගාර බිල්පත් කෙළින්ම බැංකුව මගින් නැවත වට්ටම් කර ගැනීමේ නිදහස තිබිණි.

**අනිවාර්ය ඉතිරි කිරීම්**

1971 අංක 6 දරණ අනිවාර්ය ඉතිරි කිරීම් පනත හා 1972 අංක 15 දරණ ආදායම් සීමා කිරීමේ සහ අනිවාර්ය ඉතිරි කිරීමේ නීතිය යටතේ එකතු කරන ලද මුදල්වල භාරකරු වශයෙන් තවදුරටත් ක්‍රියා කළ මහ බැංකුව, රජය වෙනුවෙන් අනිවාර්ය ඉතිරි කිරීමේ අරමුදල පරිපාලනය කළේය. වර්ෂය තුළදී බැංකුව ප්‍රතිලාභ ආපසු ගෙවීමේ අයදුම්පත් 1775 ක් වෙනුවෙන් රුපියල් 62,67,857.35 ක මුදලක් (පොලිය ඇතුළුව) ආපසු ගෙවන ලදී.

**මැදි හා දිගුකාලීන ණය අරමුදල**

1981 වර්ෂය තුළදී මහ බැංකුව සිය මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීමේ යෝජනා ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී.

ලබා දෙන ලද මුළු ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණයේ එකතුව 1980 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 143.9 සමඟ සසඳන විට 1981 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 264 ක් විය.

## ව්‍යවහාර මුදල් නිකුතුව

1981 වර්ෂය අවසානයේදී මුළු ව්‍යවහාර මුදල් සංසරණය රුපියල් දශ ලක්ෂ 5643.5 ක් විය. මෙය 1980 දෙසැම්බර් මස පැවතුන ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 634 ක හෙවත් සියයට 12.6 ක වැඩිවීමකි. 1981 වර්ෂයේ නෝට්ටු සංසරණය රුපියල් දශ ලක්ෂ 604.8 කින් වැඩි වූ අතර, කලින් වර්ෂයේදී එය වැඩි වුයේ රුපියල් දශ ලක්ෂ 667.6 කිනි. එක් අතකින් රුපියල් 1000 වටිනාකමින් යුත් අළුත් ව්‍යවහාර මුදල් නෝට්ටුවක් නිකුත් කිරීමත්, රුපියල් 100, රුපියල් 50 සහ රුපියල් 20 වටිනාකමින් යුත් ව්‍යවහාර මුදල් නෝට්ටු ප්‍රමාණය වැඩි කිරීමත්, අනෙක් අතින්, රුපියල් 10, රුපියල් 5 සහ රුපියල් 2 වටිනාකමින් යුත් මුදල් නෝට්ටු ප්‍රමාණය අඩු කිරීමත්, හේතුකොටගෙන ව්‍යවහාර මුදල් නිකුතුවෙහි සංයුතිය වෙනස් විය. රුපියල් 1000, රුපියල් 100 සහ රුපියල් 50 වටිනාකමින් යුත් ව්‍යවහාර මුදල් නෝට්ටුවල වැඩිවීම පමණක් මුළු වැඩිවීමෙන් රුපියල් දශ ලක්ෂ 612.6 ක් විය. 1981 වර්ෂයෙහි කාසි සංසරණයෙහි සමස්ථ වැඩිවීම රුපියල් දශ ලක්ෂ 29.3 ක් වූ අතර, 1980 වර්ෂයෙහි එම වැඩිවීම රුපියල් දශ ලක්ෂ 20.7 ක් විය.

කාසි සංසරණයේ සමස්ථ වැඩිවීමෙන් රුපියල් 5, රුපියල් 2, රුපියල් 1 සහ ශත 50 වටිනාකමින් යුතු කාසිවල වැඩිවීම පමණක් රුපියල් දශ ලක්ෂ 22.1 ක් විය.

රුපියල් 1000 වටිනාකමින් යුත් ව්‍යවහාර මුදල් නෝට්ටුවට අමතරව රුපියල් 500 වටිනාකමින් යුත් ව්‍යවහාර මුදල් නෝට්ටුවක් නිකුත් කිරීමට යෝජනා කර ඇත. මෙකී ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුතුවෙහි පරමාර්ථය වූයේ රුපියල් 50 සහ රුපියල් 100 වටිනාකම් වලින් යුත් නෝට්ටු සම්බන්ධයෙන් පැවතුන ඉල්ලුම ලිහිල් කිරීමය. 1981 වර්ෂය තුළදී රුපියල් 5 සහ රුපියල් 2 වටිනාකමින් යුත් අනුස්මරණ කාසි දෙකක් නිකුත් කැරිණි. පිළිවෙලින් ශ්‍රී ලංකාවට සර්වජන චන්ද බලය ලැබී වසර 50 ක් ගතවීම හා මහවැලි සංවර්ධන ව්‍යාපාරය අනුස්මරණය කිරීම සඳහා මෙම කාසි දෙක නිකුත් කරන ලදී.

1982 වර්ෂයේ පළමුවන කාර්තුවේදී ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවෙහි ව්‍යවහාර මුදල් කෞතුකාගාරයක් පිහිටුවීම සඳහා කටයුතු ආරම්භ කර ඇත.

## බැංකු කටයුතු සංවර්ධන

රටේ බැංකු ශාඛා විවෘත කිරීම සම්බන්ධයෙන් විදේශීය බැංකු හා මූල්‍ය ආයතන විසින් නිතර විමසීම් කරන ලදී. වර්ෂය තුළ විදේශීය බැංකු තුනක් මඟින් ශ්‍රී ලංකාවේ ශාඛා විවෘත කරන ලදී. ඒවා නම්, 81.03.17 දින විවෘත කරන ලද ඩුබායි බැංකුව, 81.06.02 දින විවෘත කරන ලද සී/ස යුනියන් බෑන්ක් ඔප් ද මිඩ්ල් ඊස්ට් හා 81.12.01 දින විවෘත කරන ලද ඈම්ස්ටර්ඩෑම් රොටර්ඩෑම් බැංකුව එන්. වී. ද වේ. මේ අතර, වර්ෂය තුළදී ශ්‍රී ලාංකික බැංකු ශාඛා 53 ක් විවෘත කරන ලදී. ලංකා බැංකුව විසින් විවෘත කළ ශාඛා 32 ත්, මහජන බැංකුව විසින් විවෘත කළ ශාඛා 19 ත්, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව විවෘත කළ ශාඛාවත් සීමාසහිත කොමර්ෂල් බෑන්ක් ඔප් සිලෝන් විවෘත කළ ශාඛාවත් මෙයට ඇතුළත් විය. සීමාසහිත හැටන් නැෂනල් බැංකුව විසින් ගෙවුම් කාර්යාලයක්ද විවෘත කරන ලදී. මේ අන්දමට 1981 වර්ෂය අවසානයේදී ශ්‍රී ලංකාවේ බැංකු 24 ක් ව්‍යාපාර කටයුතු කරගෙන ගිය අතර, එවකට පැවති බැංකු ශාඛා සංඛ්‍යාව 673 කි. මෙම බැංකු ශාඛා සංඛ්‍යාවට ලංකා බැංකුවේ කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා 101 ක්ද ඇතුළත් වේ.

වණික් බැංකු සේවාවන් ඇති කිරීම සඳහා ඉදිරිපත් වූ යෝජනා බැංකුව විසින් දිරිගන්වන ලදී. ප්‍රාග්ධන හා ආර්ථික සංවර්ධනය කෙරෙහි මහත් අවධාරණයකින් යුතුව කටයුතු කරන් නාවූත්, එමෙන්ම රටෙහි ආයෝජනය කිරීම සඳහා විදේශීය ආයෝජකයින් හා බැංකු ආයතන දිරි ගන්වන සුළුවූත්, වර්තමාන ආර්ථික වාතාවරණය යටතේ ව්‍යාපාරික, වෙළෙඳ හා මුදල් පිළිබඳ කටයුතු අධික වන බව සැළකිල්ලට ගෙන ඊට විශාල ප්‍රමාණයේ හා පහසුවෙන් හසුරුවා ගත හැකි වූ ප්‍රාග්ධන සම්පත් හා අළුත් මූල්‍ය පහසුකම් අවශ්‍ය වන්නේ යැයි සැලකිල්ලට ගන්නා ලදී. මෙවැනි තත්ත්වයක් යටතේ වර්ධනය වෙමින් පවතින බැංකු හා ආයෝජක සමාජයකට ආර්ථික විශේෂඥයින්ගේ උපදෙස් හා සේවය නිරතුරුවම අවශ්‍ය වේ. මෙකී සේවාවන් එකක් හෝ සියල්ලම සැපයීම වෙළෙඳ බැංකුවක සාමාන්‍ය කාර්ය පථයට අයත් නොවන බැවින්, වණික් බැංකුවක හෝ වණික් බැංකු ආයතනයක සේවය මෙහිදී වඩාත් යෝග්‍ය වනු ඇත.

බැංකු ශාඛා පිහිටුවීම ක්‍රමවත් කිරීමේ අදහසින්, බැංකු සංවර්ධන සැලැස්මක් ඇති කිරීමට පියවර ගන්නා ලදී.

## පුහුණු කිරීම්

ශාස්ත්‍රීය හා ශාස්ත්‍රීය නොවන (ප්‍රායෝගික පුහුණුවීම්) ක්ෂේත්‍රයන්හි නිළධාරීන් පුහුණු කිරීම වර්ෂය පුරාම සිදු කැරිණි. 1981 වර්ෂයේදී පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා නිලධාරීන් 10 දෙනෙක් එතෙර යවන ලදී. එම වර්ෂයේදීම නිලධාරීන් 54 දෙනෙක් කෙටිකාලීන පුහුණු පාඨමාලා, සාකච්ඡා සමුළු හා සම්මන්ත්‍රණ සඳහා එතෙර යවන ලදී. ග්‍රාමීය ණය, ග්‍රාමීය ව්‍යාපෘති හැඳිනගැනීම/තක්සේරුකිරීම/මූල්‍යකරණය හා අනෙකුත් ග්‍රාමීය සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් පුහුණුවක් ලබාදීම කෙරෙහි වැඩි උනන්දුවක් දක්වන ලදී. එසේම විදේශ විනිමය කටයුතු හා ඒ සම්බන්ධ අනෙකුත් අංශ සම්බන්ධයෙන් පුහුණුවක් ලබාදීම කෙරෙහිද බැංකුවේ වැඩි අවධානයක් යොමු විය.

මෙරට විශ්ව විද්‍යාලවල හා අනෙකුත් අධ්‍යාපනික හා වෘත්තීයමය ආයතනවල පුහුණුවක් ලබාදීමද බැංකුවේ පුහුණු කිරීම් වැඩ පිළිවෙලට ඇතුළත් විය. මෙවැනි දේශීය පුහුණු කිරීමේ පාඨමාලා සඳහා නිලධාරීන් 43 දෙනෙකු යවන ලදී. වර්ෂය තුළදී, මහ බැංකුව මෙන්ම වෙළෙඳ බැංකු හා මූල්‍ය අංශයද අරමුණු කර ගෙන, පුහුණු කිරීමේ වැඩ සටහනේ කොටසක් වශයෙන්,

සාකච්ඡා සමුළු කීපයක්ම පවත්වන ලදී. 1981 සැප්තැම්බර් මාසයේදී මහ බැංකුවේ ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය පිහිටුවීමත් සමඟ එකී ආයතනය විසින් පොදුවේ බැංකු හා වාණිජ අංශයේ පුහුණු කිරීමේ කටයුතු පවරා ගන්නා ලදී. මහ බැංකු සේවකයින් පුහුණු කිරීමේ කාර්යය තවදුරටත් මෙම දෙපාර්තමේන්තුවේ වගකීම වනු ඇත.

## බැංකු පරිපාලන

බැංකු පරිපාලන දෙපාර්තමේන්තුව විසින් මුදල් නීති පනතේ 29 (1) වගන්තිය යටතේ 1981 වර්ෂය තුළ වාණිජ බැංකු දහඅටක පරීක්ෂණ කටයුතු අවසන් කරන ලද අතර 1980/81 පරීක්ෂණ කාලය තුළ ක්‍රියාත්මකව තුබූ සෑම වාණිජ බැංකුවකම පරීක්ෂණ කටයුතු මේ අනුව අවසන් කරන ලදී. තවද, මුදල් නීති පනතේ 29 (2) වගන්තිය යටතේ වාණිජ බැංකු නොවන බැංකු ආයතන දෙකක්ද මෙම දෙපාර්තමේන්තුව විසින් 1981 වර්ෂය තුළ පරීක්ෂණයට භාජනය කරන ලදී.

1979 අංක 27 දරන මුදල් සමාගම් පාලන පනතේ විධිවිධානයන්ට අනුව මුදල් මණ්ඩලය වෙත ලියාපදිංචි වූ මුල්‍ය සමාගම් අධීක්ෂණය කිරීම හා පරීක්ෂණය කිරීමෙහිද මෙම දෙපාර්තමේන්තුව නිරත විය. පනතේ 15 (1) වගන්තිය යටතේ මුදල් සමාගම් හතක පරීක්ෂණ කටයුතු වර්ෂය තුළ ආරම්භ කරන ලද අතර, එයින් හතරක පරීක්ෂණ අවසන් කරනු ලැබීය. පනත යටතේ ලියාපදිංචි වීම සඳහා මුදල් සමාගම් විසින් එවන ලද අයදුම්පත් අගැයීමට ලක්කොට එයින් මුදල් සමාගම් දෙකක් වර්ෂය තුළදී මුදල් මණ්ඩලය වෙත ලියාපදිංචි කරන ලදී. මුදල් සමාගම් විසින් මහජනයාගෙන් තැන්පතු ලබා ගැනීම සඳහා පළ කරනු ලබන වෙළඳ දැන්වීම් පාලනය කිරීම සඳහා 1981 ජූලි මාසයේදී මුදල් මණ්ඩලය විසින්, එකී පනත යටතේ රෙගුලාසි පනවනු ලැබීය.

විදේශ ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය යටතේ වාණිජ බැංකු විසින් ස්ථාපනය කරන ලද විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක මගින් කරනු ලබන ගනුදෙනු පිළිබඳව විමසිලිමත්ව සිටීමේ වැඩ පිළිවෙලෙහි දෙපාර්තමේන්තුව දිගටම නියුතු විය.

## සංවර්ධන මුදල්

ග්‍රාමීය ණය හා සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුව, සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුව යනුවෙන් අළුතින් නම් කරන ලදී. කලින් පැවති ග්‍රාමීය ණය හා සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුවෙහි තිබූ ග්‍රාමීය ණය අංශය භාරව කටයුතු කිරීම සඳහා ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව යනුවෙන් හැඳින්වෙන නව දෙපාර්තමේන්තුවක් 1981 දෙසැම්බර් 1 වැනි දින සිට ආරම්භ කරන ලදී.

### මධ්‍ය හා දිගුකාලීන ණය අරමුදල

දෙපාර්තමේන්තුව අළුතින් නම් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයට පහත දැක්වෙන ප්‍රතිමූල්‍ය වර්ගයන් අදාළ වේ:

(i) වර්ග II ට අයත් වනුයේ ශ්‍රී ලංකාවෙන් කරනු ලබන අපනයන නඟා සිටුවීම හා වර්ධනය සඳහා දෙනු ලබන ණය වේ. අපනයනය කිරීම සඳහා භාණ්ඩ හා ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමද, එසේ නිෂ්පාදනය කිරීමට පෙරාතුව කරනු ලබන කාර්ය යන්ද මීට ඇතුළත්ය;

(ii) වර්ග III ට අයත් වනුයේ බදු විරාම සහිත අනුමත කළ ආයෝජන සඳහා දෙනු ලබන සියළුම ණයත්, අමාත්‍යාංශ මගින් අනුමත කළ යෝජනා ක්‍රමවලට බාහිර වශයෙන් කෘෂිකර්මය හා ධීවර කර්මාන්ත වෙනුවෙන් දෙන ලද ණයත්ය;

(iii) වර්ග IV ට අයත් වනුයේ ඉහත සඳහන් කර ඇති කාර්යයන්ට අමතරව, මුදල් නීති පනතේ 88 වැනි ඡේදය යටතේ විස්තර කර ඇති අන්දමට ''ඵලදායී කාර්යයන්'' යන අර්ථය යටතට ගැනෙන්නේ යැයි මුදල් මණ්ඩලය විසින් ස්වකීය අභිමතය පරිදි සළකනු ලබන කාර්යයන් සඳහා දෙනු ලබන ණය වේ.

වර්ග 1 යටතට ගැනෙන ණය ප්‍රතිමූල්‍යකරණය වෙනත් කටයුතු සමඟ ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුවට පවරන ලදී.

අපනයන නහා සිටුවීම (II වර්ගය) හා ඒවා වර්ධනය කිරීම සඳහා අනුග්‍රහ මුදල් යෙදවීම පිණිස ප්‍රතිමූල්‍ය පහසුකම් සැළසීම 1980 ඔක්තෝබර් මාසයේදී ආරම්භ විය. මෙම පහසුකම යටතේ මහ බැංකුව විසින් ණය මුදලෙන් සියයට 80 ක ප්‍රමාණයක් සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සපයනු ලැබේ. මෙහි ප්‍රතිමූල්‍ය අනුපාතය වර්ෂයකට සියයට 10 ක් වන අතර, ප්‍රතිමූල්‍ය පහසුකම් ලබන ණය මුදල්වල පොළී අනුපාතිකය සියයට 13 ක් හෝ ඊට අඩු විය යුතුය. මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය ක්‍රමයේ වර්ග III හා IV යටතේ මෙන් නොව වර්ග II යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් ප්‍රයෝජනයට ගන්නාවූ වෙළෙඳ බැංකු විසින් මුළු ණය සඳහා වර්ෂයකට සියයට 13 ක ඒකාකාර අනුපාතිකයක් අය කළයුතු විය. එකී මුළු ණය ප්‍රමාණයට බැංකුවල සම්පත් වලින් සියයට 20 ක් ඇතුළත් විය. මෙම පිළිවෙත එම වැඩපිළිවෙලට සහභාගී වන්නාවූ ණය දෙන ආයතනවල ප්‍රසාදයට හේතු නොවීය. එහෙයින් අපනයන ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා ගැනීමට වෙළෙඳ බැංකු තරමක් මැළි වූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ව්‍යවසායයන් 40 කට පමණ අපනයන කර්මාන්ත තත්ත්වය ප්‍රදානය කර තිබියදීත්, 1981 වර්ෂයේදී වෙළෙඳ බැංකු විසින් ඉදිරිපත් කර තිබුනේ අයදුම්පත් 14 ක් පමණකි. වෙළෙඳ බැංකුවල මෙම උදසීනකමට බොහෝ සෙයින් හේතු වූයේ අපනයන නැඹුරු ව්‍යාපෘතිවල සිය ධනය යෙදවීමෙන් ලැබීමට නියමිත ලාභය නිල වශයෙන් ම අඩු කර තිබීමයි. එමනිසා වෙළෙඳ බැංකු මෙම යෝජනා ක්‍රමයට සාර්ථක ලෙස සම්බන්ධ කරවා ගනු වස් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය මගින් අනුමැතිය ලැබූ අපනයන ව්‍යාපෘතිවලට දෙන ප්‍රතිමූල්‍ය පහසුකම් සියයට 100 ක්ම ලබා දීමට මහ බැංකුව එකඟ විය. එකී වෙනස් කිරීමට අනතුරුව ඒ ඒ වර්ග මැදි හා දිගු කාලීන ණය යටතේවූ ප්‍රතිමූල්‍ය පහසුකම්වලට අදල සංශෝධිත විධිවිධාන හා කොන්දේසි පහත 2.3 දරන සංඛ්‍යා සටහනෙහි දක්වේ.

**2 · 3 සංඛ්‍යා සටහන**

**මධ්‍යම හා දීර්ඝකාලීන ප්‍රතිමූල්‍ය ආයෝජන**

| වර්ගය | මුළු ණයෙහි ප්‍රතිමූල්‍ය ප්‍රමාණය (ප්‍රතිශතය) % | ණයෙහි කාලය (අවුරුදු) | ප්‍රතිමූල්‍යයේ පොළී අනුපාතිකය | | ණය දෙන ආයතනයට දී ඇති සීමාව | | එක් ව්‍යවසායයක් විසින් ව්‍යාපෘතියේ මුළු අගයෙන් වැය කළ යුතු අවම කොටස % |
|---|---|---|---|---|---|---|---|
| | | | (අ) ව්‍යාපෘතියේ අගය රුපියල් දශ ලක්ෂ 5 හෝ ඊට අඩු % | (ආ) ව්‍යාපෘතියේ අගය රුපියල් දශ ලක්ෂ 5 හෝ ඊට වැඩි % | (අ) ව්‍යාපෘතියේ අගය රුපියල් දශ ලක්ෂ 5 හෝ ඊට අඩු % | (ආ) ව්‍යාපෘතියේ අගය රුපියල් දශ ලක්ෂ 5 හෝ ඊට වැඩි % | |
| I | 100 | 3 – 15 | 8 1/2 | 8 1/2 | 4 | 4 | 10 |
| II | 100 | 3 – 15 | 10 | 11 1/2 | 2 | 1 1/2 | 20 |
| III | 60 | 3 – 15 | 11 | 11 | 5 | 5 | 20 |
| IV | 60 | 3 – 15 | 13 | 13 | 5 | 5 | 20 |

අපනයන නැඹුරු කර්මාන්ත සංවර්ධනය කිරීමෙහි ලා වඩාත් පුළුල් වශයෙන් වෙළෙඳ බැංකු හා ණය දෙන ආයතන සහභාගි කර ගනු වස් ප්‍රතිමූල්‍ය ක්‍රමයේ ක්ෂේත්‍රය 1981 වර්ෂයේදී තවදුරටත් පුළුල් කරන ලදී. 1981 ඔක්තෝබර් මාසයේදී කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි, මධ්‍ය හා දිගුකාලීන ණය අරමුදලෙන් ණය ලබා ගැනීමට මෙතෙක් සුදුසුකම් ලබා නොසිටි රාජ්‍ය අංශයේ සංස්ථාවලට, නියමිත එක් ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් රුපියල් දශ ලක්ෂ 30 ක උපරිමයක සීමාවට යටත්ව එම අරමුදලෙන් ණය ලබා ගැනීමට ඉඩ දෙන ලදී.

මීට අමතරව 1980 වර්ෂයේදී ප්‍රථම වරට පනවන ලද, මධ්‍ය හා දිගුකාලීන ණය අරමුද ලෙන් ආධාර ලබා ගැනීමට සුදුසුකම් ඇති ව්‍යාපෘති මගින් මහජනයාට කොටස් විකිණිය යුතු යැයි යන කොන්දේසිය 1981 වර්ෂයේදී තවදුරටත් ක්‍රියාත්මකව පැවතුනේය. මෙම කොන්දේසියේ පරමාර්ථය වූයේ සමාගම්වල අයිතිය පුළුල්ව තබා ගැනීමට උනන්දු කරවීමත්, රටේ ක්‍රියාශීලී ව්‍යාපාර වස්තු වෙළෙඳපොලක් තබා ගැනීමට පෙළඹවීමත්ය. ප්‍රතිමූල්‍ය ආධාර සළසා ඇති වර්ග II, III හා IV යටතේ එන රුපියල් දශ ලක්ෂ 5 ක් ඉක්මවන්නාවූ සියළුම ණය සඳහා එකී කොන්දේසිය අදළ වේ.

1981 වර්ෂයේදී, වර්ග III හා IV යටතේ වෙන් කර ඇති ණය වෙනුවෙන් මධ්‍ය හා දිගු කාලීන ණය අරමුදලෙන් රුපියල් දශ ලක්ෂ 260.9 ක් ප්‍රතිමූල්‍ය වශයෙන් අනුමත කරන ලදී. 1980 වර්ෂයේදී එයට අනුමත කරන ලද්දේ රුපියල් දශ ලක්ෂ 121.7 කි. ඒ ඒ කාර්යයන් සඳහා වර්ගීකරණය කරන ලද ප්‍රතිමූල්‍ය සටහනක් පහත දැක්වේ.

**2 . 4 සංඛ්‍යා සටහන**

**මධ්‍ය හා දිගුකාලීන ප්‍රතිමූල්‍ය අනුමත කිරීම්**

**කාණ්ඩ III හා IV**

(රුපියල් දශ ලක්ෂ)

| ශීර්ෂය | 1979 | | 1980 | | 1981 | |
|---|---|---|---|---|---|---|
| | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය |
| කෘෂිකර්ම | 1·0 | 1·0 | 1·0 | 0·7 | 31·5 | 19·9 |
| ධීවර | 1·7 | 1·7 | – | – | – | – |
| කර්මාන්ත | 38·1 | 27·7 | 62·1 | 49·0 | 77·0 | 67·6 |
| හෝටල් | – | – | 52·0 | 36·0 | 105·7 | 83·6 |
| අනෙකුත් | 0·5 | 0·5 | 60·0 | 36·0 | 145·5 | 89·8 |
| එකතුව | 41·3 | 30·9 | 175·1 | 121·7 | 359·7 | 260·9 |

1981 වර්ෂයේදී අපනයන අංශයට ප්‍රතිමූල්‍ය සැපයීම (මධ්‍ය හා දිගු කාලීන ණය අරමුදලේ II වර්ගය) පහත සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

**2 . 5 සංඛ්‍යා සටහන**

**මධ්‍ය හා දිගුකාලීන ප්‍රතිමූල්‍ය අනුමත කිරීම් – අපනයන අංශය**

(රුපියල් දශ ලක්ෂ)

| | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය |
|---|---|---|
| අපනයන අංශයේ ව්‍යාපෘති .. .. | 35·4 | 32·0 |
| එකතුව .. .. | 35·4 | 32·0 |

ගත වූ වර්ෂයට වඩා මධ්‍ය හා දිගුකාලීන ණය අරමුදල යටතේ වූ කාර්යයන් සැළකිය යුතු අන්දමින් වැඩි වී ඇති බැව් ඉහත සඳහන් සංඛ්‍යා සටහන් දෙකෙන් පැහැදිලි වෙයි. මෙම වැඩි වීමට හේතු වූයේ මහ බැංකුව විසින් සළසන ලද ආකර්ශණීය අඩු පොළී අනුපාතිකයනුත්, ණය දෙන ආයතන විසින් වැඩි වැඩියෙන් කාලීන වශයෙන් ණය දීමත් ය.

**සුළු පරිමාණයේ කර්මාන්ත සඳහා ණය සහතික ක්‍රමය**

සුළු පරිමාණයේ කර්මාන්ත සඳහා ණය සහතික ක්‍රමය 1978 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී. කාර්මික සංවර්ධන මණ්ඩලයේ නිර්දේශ මත මහජන බැංකුව, ලංකා බැංකුව, ශ්‍රී ලංකා සංවර්ධන මුදල් සංස්ථාව වැනි අනුමත කරන ලද ණය දෙන ආයතන විසින් දෙනු ලබන ණය සඳහා එකී ක්‍රමය යටතේ මහ බැංකුව විසින් රජය වෙනුවෙන් ණය සහතික සපයයි. ණය සහතිකයේ ප්‍රමාණය මුළු ණය වගකීමෙන් සියයට 75 කි. 1980 වර්ෂය අවසාන වනවිට මහ බැංකුව විසින් මුළු මුදල රුපියල් දශ ලක්ෂ 30.9 ක් වන ණය 764 ක් සඳහා ණය

සහතික සපයා තිබුණි. 1981 වර්ෂයේදී මුළු මුදල රු. 3,49,000 ක් වන ණය 3 ක් සඳහා පමණක් ණය සහතික නිකුත් කරන ලදී. ජාතික සංවර්ධන බැංකුවේ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය ක්‍රමය ආරම්භ වීමත් සමගම, කුඩා පරිමාණ කර්මාන්ත ව්‍යාපෘති ක්‍රමය යටතේ වූ කාර්යයන් ක්‍රමයෙන් අඩු විය.

සුළු පරිමාණ කර්මාන්ත ව්‍යාපෘති ක්‍රමය හා සම්බන්ධ වාර මුදල් එකතු කිරීම හා ප්‍රගතිය ගැන සොයා බැලීම වැනි පශ්චාත් ණය සහතික කාර්යයන් 1981 වර්ෂයේදීද පවත්වාගෙන යන ලදී. තවද, ණය දෙන ආයතනවලින් ණය සහතික හිමිකම් පෑම් දෙපාර්තමේන්තුවට ලැබෙන අතර, ඒවා මුදල් ගෙවීම සඳහා ඉදිරිපත් කිරීමට පෙරාතුව හොඳින් පරීක්ෂාකර බලනු ලැබේ. ණය දීම් 33 ක් සඳහා ණය සහතික හිමිකම් පෑම් ලැබූ අතර, පරීක්ෂණ කටයුතු අවසන් නොවීමේ හේතුවෙන් ඉන් එකක් වෙනුවෙන් හෝ තවම මුදල් ගෙවා නැත.

ණය සහතික සපයන ලද ණයවල සමුච්චිත වටිනාකමද, තවමත් ක්‍රියාත්මක වන ණය සහතික වෙනුවෙන් මහ බැංකුවට දරන්නට සිදුවී ඇති අවදානමද පහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**2 · 6 සංඛ්‍යා සටහන**

(රුපියල් දශ ලක්ෂ)

| | 1980 | 1981 |
|---|---|---|
| ණයවල මුළු වටිනාකම .. .. | 30·6 | 31·0 |
| ණය සහතික සපයා ඇති ණයවල නොපියවා ඇති මුළු ශේෂය .. | 24·3 | 17·1 |
| භාජනය වී ඇති 75% අවදානම .. .. | 18·2 | 12·8 |
| මෙම ක්‍රමය යටතේ ණය සහතික සපයන ලද මුළු ණය මුදලෙහි දරන්නට සිදුවී ඇති අවදානම ප්‍රතිශතයක් වශයෙන් .. | 59·8% | 41·3% |

**කුඩා සහ මධ්‍ය පරිමාණයේ කර්මාන්ත — ණය සහතික ක්‍රමය**

ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවේ කුඩා සහ මධ්‍ය පරිමාණයේ කර්මාන්ත ක්‍රමය යටතේ දෙනු ලබන ණය ආවරණය කිරීම සඳහා ණය සහතික ක්‍රමයක් ඇති කිරීම, මුදල් නීති පනතේ අංක 108 ඒ වගන්තිය යටතේ, 1979 වර්ෂය අවසානයේදී මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද්දේ 1979 ඔක්තෝබර් මාසයේදීය. එකී ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 16 ක ණය මුදලක් ජාතික සංවර්ධන බැංකුව විසින් ශ්‍රී ලංකා ආණ්ඩුවේ මාර්ගයෙන් ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් ලබා ගන්නා ලදී. කුඩා සහ මධ්‍ය පරිමාණයේ කර්මාන්ත සඳහා දෙන ලද ණය වෙනුවෙන් සියයට 80 ක ප්‍රතිමූල්‍ය පහසුකම් සලසනු වස්, මෙම මුදලෙන් එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 12 ක් එයට සහභාගිවන ණය දෙන ආයතනවලට (ලංකා බැංකුව, මහජන බැංකුව, සංවර්ධන මුදල් සමායතනය, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, සීමාසහිත ලංකා වාණිජ බැංකුව) ආධාර පිණිස වෙන් කරන ලදී. තවද එසේ දෙනු ලබන ණය වලින් සියයට 60 ක් ආවරණය කිරීම පිණිස ණය සහතික ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලදී.

දෙන ලද ණය මුදල්වල කැඩී සටහනක්ද, මහ බැංකුව විසින් සපයා ඇති ණය සහතික වල පරිමාණයද මෙම ක්‍රමයේ ආරම්භයේ පටන් ණය සහතික නිකුත් කර ඇති ව්‍යාපෘතීන්හි කර්මාන්ත අනුව කරන ලද වර්ගීකරණයද පහත දී ඇති සටහනෙහි දැක්වේ.

**2 · 7 සංඛ්‍යා සටහන**

**1980 – 81 දී නිකුත් කරන ලද කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා ණය සහතික**

රුපියල් '000

| කර්මාන්ත | 1980 | | 1981 | |
|---|---|---|---|---|
| | ණය | ප්‍රමාණය | ණය | ප්‍රමාණය |
| 1. වී කෙටීම .. .. | 98 | 11,946 | 200 | 23,911 |
| 2. ලුහු ඉංජිනේරු .. .. | 62 | 6,862 | 73 | 6,266 |
| 3. ගඩොල් හා අනෙකුත් ගොඩනැගිලි ද්‍රව්‍ය .. | 130 | 15,245 | 111 | 21,352 |
| 4. නිමි ඇඳුම්, බතික්, අත්යන්ත්‍ර රෙදිපිළි, බුමුතුරුණු ආදිය .. .. | 67 | 5,357 | 52 | 4,988 |
| 5. රබර් උපයෝගී කර නිපයන භාණ්ඩ .. | 9 | 768 | 16 | 3,447 |
| 6. පාවහන් සහ අනෙකුත් සම්භාණ්ඩ .. | 11 | 728 | 6 | 660 |
| 7. හකුරු සහ උක් භාවිතා කොට කැරෙන නිෂ්පාදන · | 1 | 29 | 4 | 91 |
| 8. ලී බඩු හා අනෙකුත් ගෘහ භාණ්ඩ .. | 41 | 4,692 | 15 | 4,246 |
| 9. කොහු සහ කොහු ආශ්‍රිත නිෂ්පාදන .. | 55 | 4,208 | 27 | 2,813 |
| 10. ලිපි ද්‍රව්‍ය හා අනෙකුත් කඩදසි නිෂ්පාදන .. | 22 | 3,849 | 6 | 905 |
| 11. ආහාර හා පාන වර්ග .. .. | 33 | 2,934 | 26 | 1,900 |
| 12. තීන්ත, පොලිෂ්, වාර්නිෂ්, වැනි දෑ .. | 2 | 600 | 6 | 1,293 |
| 13. ගුවන් විදුලි යන්ත්‍ර, බයිසිකල් ආදිය සඳහා අමතර කොටස් .. .. | 8 | 244 | 5 | 119 |
| 14. සබන් හා අනෙකුත් ප්‍රසාධන භාණ්ඩ .. | 10 | 321 | 18 | 1,316 |
| 15. හස්ත කර්මාන්ත හා ක්‍රීඩා භාණ්ඩ .. | 9 | 412 | 19 | 654 |
| 16. සුරුට්ටු හා බීඩි නිෂ්පාදන · .. | 3 | 21 | 3 | 26 |
| 17. ධීවර යාත්‍රා හා මිරිදිය ධීවර කටයුතු .. | 7 | 2,092 | 4 | 1,600 |
| 18. ස්වර්ණාභරණ හා මැණික් .. .. | 2 | 208 | 6 | 977 |
| 19. ක්‍රීඩා භාණ්ඩ .. .. | 1 | 65 | 1 | 15 |
| 20. කෘෂි උපකරණ .. .. | 2 | 420 | 2 | 44 |
| 21. වීදුරු හා අනෙකුත් වීදුරු නිෂ්පාදන .. | 4 | 490 | 3 | 361 |
| 22. පිත්තල හා ඇළුමිනියම් භාණ්ඩ .. | 31 | 2,120 | 47 | 4,051 |
| 23. විවිධ .. .. | 18 | 2,125 | 36 | 3,179 |
| 24. මුද්‍රණ .. .. | — | — | 29 | 6,060 |
| 25. ලී ඉරීම .. .. | — | — | 48 | 8,840 |
| එකතුව .. .. | 626 | 65,736 | 763 | 99,114 |

මෙම ක්‍රමයෙන් වඩාත් යහපතක් සැළසුනේ රටේ අර්ධ නාගරික ජනගහනයෙන් ඉතා විශාල කොටසක් ඇතුලත් කොළඹ, කුරුණෑගල, පුත්තලම, ගම්පහ, මහනුවර, මාතර සහ යාපනේ යන දිස්ත්‍රික්කවලටය. ඒ අතර කොහු සැදීම, ගඩොල් තැනීම, වී කෙටීම, උළු සැදීම හා කළුගල් කැඩීම වැනි දේශීය කර්මාන්ත රාශියක්ම ජීවායේ සංවර්ධනය උදෙසා මුදල් ආධාර වලින් වැඩි කොටසක් ලබා ගන්නා ලදී.

ණය සහතික සපයන ලද ණය වෙනුවෙන් මහ බැංකුවට දරන්නට වන අවදානම පහතින් දී ඇති සංඛ්‍යා සටහනේ දැක්වේ.

**2·8 සංඛ්‍යා සටහන**

**කුඩා සහ මධ්‍ය පරිමානයේ කර්මාන්ත සඳහා සපයන ලද ණය සහතික හා දරන්නට වන අවදානම**

රුපියල් දශ ලක්ෂ

| | 1980 | 1981 |
|---|---|---|
| නිකුත් කර ඇති ණය සහතික වලින් ආවරණය වන මුළු වටිනාකම .. | 65·8 | 164·8 |
| දරන්නටවන අවදානමේ 60% .. .. | 39·5 | 98·9 |

ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් දෙන ලද ණය මුදල අවසාන වීමත් සමඟම, 1982 පළමුවැනි කාර්තුව තරමේදී කුඩා සහ මධ්‍ය පරිමාණයේ කර්මාන්ත (I) ක්‍රමයේ කටයුතු හමාර කිරීමට බලාපොරොත්තු වනු ලැබේ. 1981 වර්ෂයේදී, ජාතික සංවර්ධන බැංකුව රජයේද එකඟත්වය ඇතුව, කුඩා සහ මධ්‍ය පරිමාණයේ කර්මාන්තවලට ඉදිරි වර්ෂවලදී මුදල් යෙදවීම සඳහා එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 30 ක දෙවැනි ණයක් ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් ලබා ගැනීමට කටයුතු කරන ලදී. මේ අනුව කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත (II) ක්‍රමය ඊට සම්බන්ධ වන ණය දෙන ආයතන මාර්ගයෙන් ප්‍රතිමූල්‍ය පහසුකම් සැලසීමට දිගටම කටයුතු කරනු ඇත. යෝජිත කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (II) ක්‍රමය යටතේ කුමන ව්‍යාපෘතියකට හෝ ලබාගත හැකි උපරිම ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2 ක් වශයෙන් නියම කැර තිබේ. කුඩා සහ මධ්‍ය පරිමාණයේ කර්මාන්ත (I) ක්‍රමය යටතේ එයට නියමිතව තිබුණේ රුපියල් දශ ලක්ෂ 1 ක් පමණෙකි. ජාත්‍යන්තර සංවර්ධන සංගමය සහඹ පැවැත්වූ සාකච්ඡාවලට සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුව සහභාගි විය. රුපියල් 8,00,000 ක උපරිම ආවරණයක් ඇති ණය සඳහා මහ බැංකුව විසින් සියයට 60 දක්වා ණය සහතික තවදුරටත් නිකුත් කරනු ඇත. කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (I) ක්‍රමය යටතේ මෙසේ ණය සහතික මහ බැංකුව විසින් නිකුත් කරන ලද්දේ රුපියල් 4,00,000 දක්වා ආවරණය ඇති ණය සඳහා පමණෙකි. මෙම ක්‍රමයට සහභාගිවන බැංකුවලට නිකුත් කිරීමට ඇති අදාළ ස්ථාවර නියෝග සකසා අවසාන කර ඇති අතර, එකී ක්‍රමය යටතේ කටයුතු කිරීම 1982 වර්ෂයේ මුල් කාලයේදී පටන් ගැනීමට නියමිතය.

## ග්‍රාමීය ණය

මුදල් නීති පනතේ 33 වැනි වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් 1981 දෙසැම්බර් 1 වැනි දින සිට මහ බැංකුවේ ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. මෙහි ඇති වැදගත්කම නම්, ග්‍රාමීය අංශය සඳහා බැංකු ක්‍රමය මගින් සලසන ණය පහසුකම් හසුරුවීම සහ පාලනය කිරීම පිළිබඳව වැඩි වගකීමක් මහ බැංකුව විසින් දරනු ලැබීමයි.

මෙම නව දෙපාර්තමේන්තුව පිහිටුවීමත් සමඟම, කලින් ග්‍රාමීය ණය සහ සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුව විසින් ග්‍රාමීය ණය සහ ග්‍රාම සංවර්ධනය සම්බන්ධයෙන් කරන ලද සියළුම කාර්යයන් මෙම දෙපාර්තමේන්තුවට පවරන ලදී. මෙම කාර්යයනට පහත සඳහන් කටයුතු ඇතුළත්ය.

1. විවිධ අමාත්‍යාංශ විසින් අනුමත කරන ලද ක්‍රම යටතේ කෘෂිකර්මය සහ ධීවර කටයුතු සඳහා දෙනු ලබන ණය සම්බන්ධයෙන් මැදි හා දිගු කාලීන ණය අරමුදල මෙහෙයවීම;

2. ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබෙන ආධාර මගින් මුදල් සපයනු ලබන ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම;

3. ග්‍රාමීය ණය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති උපදේශක මාලාව පිළිබඳව අධ්‍යයනය කොට වාර්තා කිරීම සහ වෙළෙඳ බැංකු ශාඛා සහ වෙනත් ණය දෙන ආයතන, දෙපාර්තමේන්තුව විසින් පිරික්සීමෙන්ද කලින් කල දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සාකච්ඡා, සම්මේලන මගින් ලබා ගත් තොරතුරුද පදනම් කොට එකී ප්‍රතිපත්ති නිරතුරුවම සමාලෝචනයට භාජනය කිරීම සහ

4. ග්‍රාමීය ණය සම්බන්ධ බැංකු සහ වෙනත් ණය ආයතනවල කටයුතු සම්බන්ධීකරණය කිරීම.

## ග්‍රාමීය ණය උපදේශක මණ්ඩලය

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ණය කටයුතු පිළිබඳව ජාතික ප්‍රතිපත්ති උපදෙස් මාලාවක් සකස් කරනු පිණිස 1980 වර්ෂයේදී මුදල් හා ක්‍රම සම්පාදන ඇමතිතුමා විසින් ඇති කරන ලද ග්‍රාමීය ණය උපදේශක මණ්ඩලයේ ප්‍රථම රැස්වීම, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී, මෙම දෙපාර්තමේන්තුව විසින් කැඳවන ලදී. මෙම මණ්ඩලයට පැවරුනු කාර්යයනට පහත සඳහන් දෑ ඇතුළත් විය.

(i) රටට සුදුසු ස්ථාවර ග්‍රාමීය ණය ව්‍යුහයක් සංවිධානය කිරීම;

(ii) ග්‍රාමීය ණය සහ ග්‍රාම සංවර්ධනය පිළිබඳ කටයුතුවල නියැලි විවිධ ආයතන අතර සම්බන්ධකම් සහ මෙහෙයවුම් සබඳතා තීරණය කිරීම;

(iii) ග්‍රාමීය ණය පිළිබඳව ජාතික ප්‍රතිපත්ති උපදෙස් මාලාවක් සකස් කිරීම;

(iv) කෘෂිකාර්මික සහ ආශ්‍රිත අංශයනට සලසනු ලබන ණය සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවෙන් දෙන ප්‍රතිමූල්‍ය පහසුකම්වල ස්වභාවය සහ ප්‍රමාණය තීරණය කිරීම;

( v ) ශක්‍යතාවයක් නොමැති ගොවීනට මුදල් ආධාර දිය යුතු ආකාරය සහ ඔවුනට මුදල් දිය යුත්තේ කුමන ආයතනයක් මගින්ද යන්න තීරණය කිරීම;

(vi) සුළු ගොවීනට ප්‍රමාණවත් ලෙස ණය පහසුකම් සැළසෙන බවට වග බලා ගැනීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව සොයා බැලීම;

(vii) ක්‍රියාත්මක කොට පවත්නා විවිධ සංවර්ධන යෝජනා ක්‍රම වරින් වර සමාලෝචනය කිරීම, නියමිත කාල වේලාවට ඒවායේ ප්‍රගතියක් නොලැබීමට හේතු වන සාධක ගැන සොයා බැලීම සහ එකී බාධක මග හරවාලීම සඳහා ගත යුතු සුදුසු පියවර යෝජනා කිරීම.

1981 වර්ෂය තුළදී මණ්ඩලය විසින් රැස්වීම් වාර හතරක් පවත්වා ඇත. බැංකු ක්‍රමයේ ග්‍රාමීය ණය මෙහෙයවුම් කටයුතු කෙරෙහි බලපාන ප්‍රධාන පෙළේ ප්‍රතිපත්තිමය වෙනස්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා පිළි ගන්නා ලදී. 1977 ජනවාරි 1 වැනි දින සිට 1981 ජූනි 30 වැනි දින තෙක් කාලසීමාව තුළ ගොවීනට දෙන ලද ණය මුදල් නැවත උපලේඛනගත කිරීමට තීරණය කරන ලදී. ග්‍රාමීය ණය උපදේශක මණ්ඩලය විසින් යෝජනා කරන ලද නැවත උපලේඛන ගත කිරීමේ ක්‍රමය මගින් ගොවීනට සහනයක් සැළසෙන අතර, ඔවුනට පුනරුත්ථාපනය වීමට අවස්ථාවක්ද ලැබෙන අතර, එමගින් අළුතින් ණය ලබා ගැනීම සඳහා ඔවුනට සුදුසුකම්ද ලැබේ. ඉහත සඳහන් කාලසීමාව තුළ ලබා ගත් සියළුම ණය මුදල් එක් ණය මුදලක් ලෙස ඒකාබද්ධ කිරීමට මෙම ක්‍රමය මගින් ඉඩ සැළසේ. මෙම ණය මුදල් ඒකාබද්ධ කිරීමේදී දණ්ඩන පොළියක් අය නොකරනු ඇත. 1981 ජූනි 30 වැනි දිනට නොබේරා ඉතිරිව තිබූ ණය මුදල මත සියයට 9 ක පොළී අනුපාතිකයක් අනුව පොළිය එකතු කරනු ඇත. ඒකාබද්ධ ණය මුදලෙන් සියයට 10 ක් ගෙවන ලෙසත්, ඉතිරිය අවුරුදු 5 ක කාලසීමාවක් තුළ අර්ධ වාර්ෂික කොටස් මුදල් 10 කින් ගෙවා නිම කරන ලෙසත් මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගැනීමට සතුටු ගොවීන් ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. සෑම ණය වාරිකයක්ම කන්නයකට අදාළ වනු ඇත. ජල පහසුකම් නොමැතිකම නිසා කන්න දෙකම වැපිරීමට නොහැකි ප්‍රදේශ තුළ ගොවීන් සඳහා අවුරුදු 10 ට නොවැඩි වන පරිදි ආපසු ගෙවීමේ කාලසීමාව දීර්ඝ කිරීම ගැන බැංකු විසින් සළකා බලනු ඇත. මුල් වාරික 7 ක් නියමිත දිනවලට ආපසු ගෙවා නිම කරන ගොවීනට, ඒකාබද්ධ ණය මුදලේ අවසාන වාරික තුන ලියා හැරීමේ අනුග්‍රහයක් ලැබෙනු ඇත. මෙම අනුග්‍රහය ලැබෙනුයේ, විධිමත් ලෙස ණය ආපසු ගෙවීම දිරි ගැන්වීමක් වශයෙනි. තමන් පුනරුත්ථාපනය වීම සඳහා මෙම ක්‍රමයෙන් ප්‍රයෝජන නොගන්නා ගොවීන් හිතා මතා ණය පැහැර හරින්නවුන් ලෙස සළකනු ලබන අතර, මෙම ණය මුදල් අය කර ගැනීම සඳහා ඔවුනට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කරනු ඇත. තවද, කිසියම් ගොවියෙක් ගෙවීමට ඇති ණය ගෙවීම හිතා මතා පැහැර හරින්නෙකු ලෙස සැළකිය හැකියයි බැංකු කළමනාකරු අදහස් කරන්නේ නම්, එවැනි ගොවියෙකුහට නැවත උපලේඛනගත කිරීමේ පහසුකම දීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් තම අභිමතය පරිදි කටයුතු කිරීමට බැංකු කළමනාකරුවනට අවසර දී ඇත. හිතා මතා ගෙවීම පැහැර හරින්නෙකු වනුයේ, ණය ආපසු ගෙවීමට හැකියාව ඇති, එහෙත්, බැංකුවට තමන් ගෙවිය යුතු මුදල නොගෙවා සිටින ගොවියෙකි. මෙම ක්‍රමය යටතේ, කිසියම් ගොවියෙකු, නැවත උපලේඛනගත කිරීම සඳහා බැංකුව විසින් පිළිගනු ලැබුවහොත්, 1982 යල් කන්නයේ වගා වියදම් පියවා ගැනීම සඳහා රාජ්‍ය බැංකු දෙකෙහි සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ, අළුත් ණය මුදලක් ලබා ගැනීමටද සුදුසුකම් ලබයි. මෙම ක්‍රමය ලංකා බැංකුව විසින් 1981 සැප්තැම්බර් මාසයේ සිට, මහ කන්නයට අදාළ වන පරිදි මන්නාරම, මුලතිව් සහ අනුරාධ පුර යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන ලදී. මෙම ක්‍රම 1982 යල කන්නයට අදාළ වන පරිදි දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

**ශ්‍රී ලංකා ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය — ආසියානු සංවර්ධන බැංකුව**

ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිළිබඳ කටයුතුවල ශීඝ්‍ර දියුණුවක් 1981 වර්ෂය තුළදී ඇති විය. 1980 පෙබරවාරි 22 වැනි දින ආසියානු සංවර්ධන බැංකුව සමඟ අත්සන් කරන ලද මෙම ණය ගිවිසුමෙන් එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 10.9 ක ණය ආධාරයක් සැළසේ. ගනු ලබන සහ බේරුම් කළයුතුව ඇති ණය මුදල් මත සියයට 1 ක වාර්ෂික සේවා

ගාස්තුවක් ගෙවිය යුතුය. ණය මුදල අවුරුදු 40 ක කාලසීමාවක් තුළ ආපසු ගෙවිය යුතු වන අතර, ආපසු ගෙවීම ඇරඹෙනුයේ අවුරුදු 10 ක අනුග්‍රහ කාලසීමාවකින් පසුවය. යෝජනා ක්‍රමයට අයත් ප්‍රදේශය තුළ ගොවිපල බලවේග උපකරණ සුලභතාව වැඩි දියුණු කිරීම, භූගත ජලය නල ළිං, කණින ලද ළිං මගින් ප්‍රයෝජනයට ගැනීම වැඩි දියුණු කිරීම සහ ග්‍රාම සංවර්ධනයට උදව් දීම සඳහා සැළසුම් කරන ලද, පුහුණු කිරීම් ඇතුළු විවිධ උපකාරක සහ ආශ්‍රිත පහසුකම් සැළසීම සඳහා මෙම ණය මුදලේ අය ලැබීම් ප්‍රයෝජනයට ගනු ඇත. ණය මුදලේ අය ලැබීම් පහත සඳහන් යෝජනා ක්‍රම අංශ සඳහා ප්‍රයෝජනයට ගනු ඇත.

| | වර්ගය | වෙන්කළ මුදල (එ. ජ. ඩොලර් දහස්) |
|---|---|---|
| 1. | ගොවිපල බලවේග උපකරණ | 4.997 |
| 2. | වාරිමාර්ග පහසුකම් | 1.069 |
| 3. | වී ඇඹරුම් මෝල් පහසුකම් | .787 |
| 4. | උපකාරක සේවා සහ පහසුකම් | .226 |
| 5. | බර අදින සතුන් සඳහා මෙරට වියදම් | .800 |
| 6. | ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය | .499 |
| 7. | වෙන් නොකළ | 2.522 |
| | එකතුව | 10.900 |

යෝජනා ක්‍රම ප්‍රදේශයට, ලංකාවේ වියළි සහ මධ්‍යස්ථ කලාපවලට අයත් අම්පාර, බදුල්ල,මඩකලපුව, හම්බන්තොට, යාපනය, පොළොන්නරුව, පුත්තලම, ත්‍රිකුණාමලය සහ වවුනියා යන දිස්ත්‍රික්ක ඇතුළත් වේ.

පසුගිය වසරු තුළදී, මහ බැංකුවේ, ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ නිලධාරීන්ට ග්‍රාමීය ණය ප්‍රතිපත්ති සහ වැඩ සටහන් පිළිබඳව එතෙරදී පුහුණු වීම් ලබාදීමට පියවර ගන්නා ලදී. ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය මගින් පැවැත්වීමට අදහස් කරනු ලබන පාඨමාලා; විෂයමාලා සහ වැඩ සටහන් සකස් කිරීමට සහය වනු පිණිස එතෙරින් උපදේශක වරුන් බඳවා ගැනීම හා සම්බන්ධ මූලික කටයුතු, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී නිම කරන ලදී. 1982 වර්ෂයේ මුල් භාගය තුළදී මෙම වැඩ කටයුතු බාර ගැනීමට උපදේශක යනට හැකිවනු පිණිස, උපදේශකවරුන් තෝරා ගැනීම 1982 වර්ෂයේ මුලදී අවසන් කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

**ණය ක්‍රම**

සමාලෝචනයට භාජනය වී ඇති වර්ෂය තුළදී, තවත් ණය ක්‍රම පහක් සඳහා මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය පහසුකම් සපයනු ලැබීය. පසුගිය වර්ෂය අවසානය වන විට, ණය ක්‍රම 12 ක් සඳහා (විස්තර 2.9 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.) ප්‍රතිමූල්‍ය පහසුකම් වශයෙන් රුපියල් දශ ලක්ෂ 334.2 ක මුදලක් වෙන් කර තැබූ අතර, එයින් රුපියල් දශ ලක්ෂ 93.16 ක් ප්‍රයෝජනයට ගැනීම නිසා වර්ෂය තුළදී ප්‍රයෝජනයට ගත් මුළු මුදල රුපියල් දශ ලක්ෂ 184.56 දක්වා ඉහළ ගිය අතර, ප්‍රයෝජනයට නොගත් ශේෂය රුපියල් දශ ලක්ෂ 149.64 ක් විය. වර්ෂය තුළදී අළුතින් ඇති කළ ණය ක්‍රම 5 ත් සමග, වෙන්කළ මුළු ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 457.07 දක්වා වැඩි විය. වර්ෂය තුළදී මෙම ණය ක්‍රම යටතේ ගෙවීම් කිසිවක් නොවීය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ප්‍රයෝජනයට නොගත් මුළු අරමුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 272.51 ක් දක්වා වැඩිවිය. මෙයින් ඇතැම් ණය ක්‍රම වහා ක්‍රියාත්මක කිරීම සඳහා පැන නැඟී ඇති බාධා ඉවත් කිරීමට පියවර ගෙන ඇති හෙයින්, 1982 වර්ෂය තුළදී විවිධ ණය ක්‍රම සඳහා වෙන් කර ඇති අරමුදල් ප්‍රමාණයන්හි ශීඝ්‍ර අඩුවීමක් ඇති වෙතැයි අපේක්ෂා කෙරේ. එක් එක් ණය ක්‍රමය යටතේ වෙන් කර ඇති මුදල් ප්‍රමාණය සහ ප්‍රයෝජනයට ගත් මුදල් ප්‍රමාණය පිළිබඳ සාරාංශයක් 2.9 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ.

## 2 · 9 සංඛ්‍යා සටහන

### ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රතිමූල්‍ය ක්‍රමයෙහි 1 වැනි කාණ්ඩය යටතේ, මුදල් මණ්ඩලය විසින් ප්‍රතිමූල්‍ය පහසුකම් සඳහා අනුමත කරන ලද, අමාත්‍යාංශ අනුග්‍රහය ලත් ණය ක්‍රම

| ණය ක්‍රමයේ නම | ප්‍රතිමූල්‍ය වෙන් කිරීම (රුපියල් දශ ලක්ෂ) | 1981.12.31 දිනට ප්‍රයෝජනයට ගත් මුදල (රුපියල් දශ ලක්ෂ) | 1981.12.31 දිනට ප්‍රයෝජනයට නොගත් මුදල (රුපියල් දශ ලක්ෂ) | ව්‍යාපෘතිය ඇරඹූ දිනය | වෙන් කරන ලද මුදල් ප්‍රදානය කළ යුතු කාලසීමාව (අවුරුදු) |
|---|---|---|---|---|---|
| අ· 1981 වර්ෂය ආරම්භයේදී පැවැති ණය ක්‍රම : | | | | | |
| 1· ඔකිඩ් වගාව සඳහා වූ ණය ක්‍රමය–ලංකා බැංකුව / ලංකා දුම්කොළ සමාගම .. .. .. | 4·50 | 2·50 | 2·00 | 03·01·79 | 3 |
| 2· පොල් පොහොර ණය ක්‍රමය .. .. .. | 55·00 | 41·20 | 13·80 | 26·03·79 | 3 |
| 3· ධීවර අංශයේ බැංකු මූල්‍ය යෝජනා ක්‍රමය .. .. | 107·00 | 98·20 | 8·80 | 02·07·79 | 3 |
| 4· වැව් වාරිමාර්ග නවීකරණ යෝජනා ක්‍රමය .. .. | 7·70 | 7·70 | — | 02·06·79 | 1 |
| 5· නුවරඑළිය දිස්ත්‍රික්කයේ කිරි පට්ටි සංවර්ධනය සඳහා වූ ණය ක්‍රමය .. | 10·00 | 3·48 | 6·52 | 22·08·79 | 3 |
| 6· කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ගොවිපළ යන්ත්‍රෝපකරණ ණය ක්‍රමය .. .. | 40·00 | 26·30 | 13·70 | 28·10·79 | 5 |
| 7· සම්මන්තුරේ ඡන්ද කොට්ඨාශයේ කිරිපට්ටි සංවර්ධනය සඳහා වන (නියාමක) ණය ක්‍රමය .. .. .. | ·12 | — | ·12 | 27·11·79 | 3 |
| 8· මහවැලි යෝජනා ක්‍රමයට අයත් ප්‍රදේශවල පදිංචිකරුවනට ට්‍රැක්ටර් මිලදී ගැනීමට ආධාර කිරීමේ යෝජනා ක්‍රමය .. | 55·00 | 5·12 | 49·88 | 19·11·79 | 3 |
| 9· මිරිදිය ධීවර කටයුතු සඳහා බැංකු මූල්‍ය යෝජනා ක්‍රමය .. | 5·20 | ·02 | 5·18 | 29·08·80 | 2 |
| 10· විවිධ සේවා සමූපකාර සමිති මගින් පොහොර ගබඩා පිහිටුවීම සඳහා වන ණය ක්‍රමය .. .. .. | 11·50 | — | 11·50 | 13·10·80 | 1 |
| 11· අබුඩාබි අරමුදලෙන් ආරම්භ කොට ඇති වයඹ මුහුදුබඩ ධීවර සංවර්ධන යෝජනා ක්‍රමය .. .. .. | 60·00 | — | 60·00 | 13·10·80 | 3 |
| 12· ඔකිඩ් වගාව සඳහා වූ ණය ක්‍රමය මහජන බැංකුව/සර්වෝදය/ලක්සල· | 3·00 | ·04 | 2·96 | 10·12·80 | 5 |
| ආ· 1981 වර්ෂය තුළ අනුමත කළ ණය ක්‍රම : | | | | | |
| 1· ධීවර සමුපකාර සමිති සඳහා ණය ක්‍රමය .. .. | 38·00 | — | 38·00 | 28·04·81 | 2 |
| 2· මාතලේ–පුත්තලම දිස්ත්‍රික්ක ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය .. .. .. .. | 54·79 | — | 54·79 | 08·05·81 | 6 |
| 3· හුලං බල යන්ත්‍ර සඳහා මුදල් යෙදවීමේ ණය ක්‍රමය .. .. | 2·56 | — | 2·56 | 11·12·81 | 1 |
| 4· මාතර දිස්ත්‍රික්කයේ යෞවන ස්වයං රැකියා ක්‍රමය .. .. | 2·70 | — | — | 10·04·81 | |
| 5· රදම්පල–උඩඅපරැක්ක ගම් දියුණු කිරීමේ ක්‍රමය .. .. | — | — | — | 16·05·81 | |
| එකතුව .. | 457·07 | 184·56 | 272·51 | | |

## ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය

ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය 1981 සැප්තැම්බර් 15 වැනි දින ආරම්භ කරන ලදී. මෙම විද්‍යාලය පිහිටුවීමේ පරමාර්ථය වනුයේ බැංකු අංශයේ නිලධාරීන් සහ කෘෂි ණය කටයුතු හා සම්බන්ධ අනෙකුත් ආයතනවල සිටින ව්‍යාප්ති කාර්‍ය්‍ය මණ්ඩල නිලධාරීන් පුහුණු කරවීමයි. කෘෂිකර්ම හා කර්මාන්ත ණය, ග්‍රාමීය බැංකු, වෙළෙඳ බැංකු හා විදේශ විනිමය මෙහෙයවුම් කටයුතු, අන්තර් ජාතික බැංකු ගණුදෙනු, ආර්ථික විද්‍යාව, අයවැය හා ණය සැළසුම් කිරීම, මිනිස් බලය සැළසුම් කිරීම, පිරිස් කළමනාකාරිත්වය හා පරිපාලනය, ගිණුම්, වාර්තා තබාගැනීම, විගණනය හා බැංකු පරීක්ෂණය, ව්‍යාපෘති හා ණය තක්සේරු කිරීම සහ දත්ත කළමනාකාරිත්වය වැනි බැංකු කටයුතු හා අදල ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පුහුණුවක් මෙම විද්‍යාලය මගින් ලබාදෙනු ලැබේ.

ඉහතින් සඳහන් කළ ප්‍රධාන ක්ෂේත්‍රවලට අමතරව, බැංකු අංශයට අදළ විශේෂ විෂයයන් සම්බන්ධයෙන් කෙටිකාලීන සාකච්ඡා සමුළු ද සංවිධානය කරනු ලැබේ. පුහුණුව ලබාදීමට අවශ්‍ය අළුත් ක්ෂේත්‍ර කලින් කලට එකතු කැරේ.

1981 සැප්තැම්බර් — දෙසැම්බර් අතර කාලය තුළදී විද්‍යාලය විසින් පහත දැක්වෙන සාකච්ඡා සමුළු හා පුහුණු කිරීමේ පාඨමාලා සංවිධානය කරන ලදී. මේවායින් සමහරක් වෙනත් බැංකු හා ආයතන හා එක්ව සංවිධානය කරන ලදී.

1. විධායක සංවර්ධන පාඨමාලාව/වැඩමුළුව
2. කුඩා පරිමාණයේ කෘෂිකර්ම ව්‍යාපෘති හැඳින ගැනීම, සැකසීම හා තක්සේරු කිරීම පිළිබඳ පුහුණුකිරීමේ පාඨමාලාව
3. ''යුනිට් ට්‍රස්ට්ස් ඇන්ඩ් පෝර්ට්පෝලියෝ මැනේජ්මන්ට්'' පිළිබඳ සාකච්ඡා සමුළුව.
4. ''කෘෂි ණය ආපසු ලබාගැනීම'' පිළිබඳ සාකච්ඡා සමුළුව.
5. ''විදේශ විනිමය තත්ත්වයේ කළමනාකාරිත්වය'' පිළිබඳ සාකච්ඡා සමුළුව/වැඩමුළුව
6. ''බදුදීම'' පිළිබඳ සාකච්ඡා සමුළුව.
7. ''කෘෂි ණය ආපසු ලබාගැනීම'' පිළිබඳ සාකච්ඡා සමුළුව.
8. ''1982 අයවැය වාර්තාව'' පිළිබඳ සාකච්ඡා සමුළුව.
9. ''කුඩා කර්මාන්තකරුවන් සඳහා වැඩ පිළිවෙලවල් හා පහසුකම්'' පිළිබඳ සාකච්ඡා සමුළුව.

## ආර්ථික පර්යේෂණ

කලින් වසර වලදී මෙන්ම, 1981 වර්ෂය තුළදීද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ආර්ථිකයේ විවිධ අංශවල ප්‍රගතිය පිළිබඳව උපදෙස් දීමෙහි සහ සමාලෝචනය කිරීමෙහි තවදුරටත් නිරත විය. විශේෂයෙන් ම, මූල්‍ය සහ බැංකු කටයුතු සංවර්ධනය, රාජ්‍ය මූල්‍ය සංවර්ධනය සහ ගෙවුම් ශේෂ තුලනය සහ විනිමය අනුපාතික වෙනස්වීම් දෙපාර්තමේන්තුවේ දැඩි පිරික්සුමට ලක් විය. මෙයට අමතරව, සාපේක්ෂ වශයෙන් වැඩි අවධානයක් එල්ල වී නොමැති ක්ෂේත්‍රයන් වන, ආර්ථික හා සමාජ පිරිවැය සහ ජනගහන සහ ශ්‍රම බල ගැටලු වැනි කරුණු පිළිබඳව සොයා බැලීමද දෙපාර්තමේන්තුව විසින් අරඹා ඇත.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ප්‍රධාන වශයෙන් මුදල් හා බැංකු කටයුතු, වෙළෙඳ, කෘෂිකර්ම, කර්මාන්ත හා රාජ්‍ය මූල්‍ය අංශවලට අයත් පර්යේෂණ ව්‍යාපෘති 23 ක් නිමකොට ඇත. විශේෂයෙන්ම වැවිලි කර්මාන්ත අංශයේ ගැටලු, ආර්ථික සමාජ පිරිවැය සඳහා කැරෙන ආයෝජනය සහ නිරතුරුවම ඇති උද්ධමන ගැටලු කෙරෙහි එකී පර්යේෂණ වැඩ පිළිවෙලින් ප්‍රමුඛත්වයක් දෙන ලදී. නිම කරන ලද ඇතැම් පර්යේෂණ අධ්‍යයනයන්හි නිරීක්ෂණ ''මාණ්ඩලික පත්‍රිකා'' ප්‍රකාශනවල පළ කොට ඇත.

### මූල්‍ය ප්‍රතිපත්තිය

1981 වසර තුළදී මූල්‍ය ප්‍රතිපත්ති ක්ෂේත්‍රයෙහි කටයුතු වේගවත් වූ අතර, මුදල් හා බැංකු කටයුතු සංවර්ධනයන්, දෙපාර්තමේන්තුවේ නිරන්තර සමාලෝචනයට භාජනව පැවතිණ. වර්ෂය තුළදී එවැනි ප්‍රතිපත්තිමය වෙනස්වීම් කිහිපයක්ම සිදු කරන ලද අතර, එවැනි ප්‍රතිපත්තිමය වෙනස් කිරීම් වලට තුඩුදුන් පසුබිම පිළිබඳව වාර්තා කිරීමේ කටයුතු වල දෙපාර්තමේන්තුව

නියුක්ත විය. 1981 මැයි මාසයේදී ණය පාලනයක් ඇති කරන ලද අතර පසුව, ඒ වෙනුවට, 1981 ජුනි මාසයේදී, වඩාත් සම්ප්‍රදායික ස්වරූපයක් ගත් ප්‍රතිපත්තීන් ඇති කරන ලදී. 1981 අගෝස්තු මාසයේදී බැංකු පොළී අනුපාතිකය වැඩි කිරීමෙන් සහ දණ්ඩන අනුපාතිකයන්හි ව්‍යුහය වෙනස් කිරීමෙන්, මූල්‍ය ප්‍රතිපත්තිය නැවත වරක් වේගවත් කරන ලදී.

**ණය සැලැස්ම**

ජාතික ණය සැලැස්මක් ඇති කිරීමේ අරමුණ ඇතිව අධිපති විසින් පත් කරන ලද ණය සැලසුම් කමිටුව සඳහා දෙපාර්තමේන්තුවේ සේවය ලැබිණි. 1981 වර්ෂය සඳහා ණය සැලැස්මක් පිළියෙල කරන ලදී. තවද, එම වර්ෂයේ සිව්වැනි කාර්තුව තුළ දී දෙපාර්තමේන්තුව, 1982 වර්ෂය සඳහා වන ණය සැලැස්මේ මූලික කටයුතු සකස් කිරීමෙහි නිරත විය.

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාකච්ඡා**

සමාලෝචනයට භාජනය වූ වසර තුළ දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අර මුදලේ නියෝජිත පිරිස් 3 කට සිය සේවය ලබා දෙන ලදී. සාකච්ඡා සහා සංවිධානයට සහ සම්බන්ධීකරණයට අමතරව, අරමුදල විසින් ඉල්ලා සිටි සියලුම සංඛ්‍යා තොරතුරු ද දෙපාර්ත මේන්තුව විසින් සපයා දෙන ලදී. වර්ෂය තුළ දී, ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව වැනි වෙනත් ජාත්‍යන්තර ආයතන වලින් පැමිණි නියෝජිත පිරිස් සඳහා ද දෙපාර්තමේන්තුවේ සේවය ලබාදෙන ලදී.

**ප්‍රකාශන**

වාර්ෂික වාර්තාව — 1980, ආර්ථික විවරණය — 1980, මාසික විවරණිකාව සහ මාණ්ඩලික පත්‍රිකා — 9 වැනි වෙලුම අංක 1 සහ 2 ආදී මහ බැංකුව නිතිපතා නිකුත් කරන ප්‍රකාශන, වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී. ආර්ථිකයේ වැදගත් අංශ ගණනාවක අළුත්ම සංඛ්‍යා තොරතුරු ඇතුලත්, ''තෝරාගත් ආර්ථික දර්ශක'' මසක් පාසා නිකුත් කරන ලදී. මෙම ප්‍රකාශනයෙහි ඇතුළත් සංඛ්‍යා තොරතුරු සඳහා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය වග කිව යුතු විය.

**විශේෂ කාර්යයන්**

''බැංකු ක්‍රමයේ ගණුදෙනුකාර සේවා'' ශීර්ෂය යටතේ නව විෂයයක් 1981 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවට පවරන ලදී. වෙනත් කරුණු අතර, මූල්‍ය සහ වෙනත් ආධාර අවශ්‍ය ''දුර්වල කර්මාන්ත'' පිළිබඳ අධ්‍යයනයන් කිරීම, මෙයට අයත් විය. එවැනි එක් කර්මාන්ත යක් පිළිබඳ වාර්තාවක් නිම කරන ලදී.

## සංඛ්‍යාන

**පාරිභෝගික මුදල් හා සමාජ ආර්ථික සමීක්ෂණය - 1978/79 සහ 1981/82**

ආදයම් සහ සේවා නියුක්තිය පිළිබඳ මූලික සමීක්ෂණ තොරතුරු ඇතුළත් ප්‍රාථමික වාර්තාවක් සකස් කර ඇත. වියදම්, ආයෝජන සහ ඉතිරිකිරීම් සම්බන්ධ දත්ත පරිගණක යන්ත්‍ර මගින් සැකසීම 1982 වසරේ මුල් කාලයේදී නිම කෙරෙනු ඇත.

1981/82 පාරිභෝගික මුදල් සහ සමාජ ආර්ථික සමීක්ෂණයේ ක්ෂේත්‍ර කටයුතු 1981 වසරේ ඔක්තෝබර් මාසයේ ඇරඹුණි. වට දෙකක් සඳහා දත්ත රැස්කර ඇති අතර, ඒවා පරි ගණක සැකසුම් කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත.

**සැළැසුම් කරන ලද ආයෝජන පිළිබඳ සමීක්ෂණය**

මෙම සමීක්ෂණය වාර්ෂික පදනමක් මත පැවැත්වේ. 1980 සැළසුම් කරන ලද ආයෝ ජන පිළිබඳ සමීක්ෂණ වාර්තාව දැන් පිළියෙල වී ඇත. 1981 වසරේ කරන ලද සැබෑ ආයෝජන සහ 1982 වසරේ සැළසුම් කර ඇති ආයෝජන සම්බන්ධ ප්‍රශ්නාවලීන් වසර අවසානයේ තැපැල් කර යවා ඇත.

**වී වගා කරන්නන්ට ණය සැපයීම සහ ඔවුන්ගේ ණයගැතිභාවය සම්බන්ධ සමීක්ෂණය–1976**

මෙම සමීක්ෂණය පිළිබඳව වාර්තාව පළකොට ඇත.

**දීපව්‍යාප්ත දත්ත රැස්කිරීමේ සැළැස්ම**

1978 වර්ෂයේ අරඹන ලද දීපව්‍යාප්ත දත්ත රැස්කිරීමේ සැළැස්ම 1981 වර්ෂයේද ක්‍රියාත් මක කැරුණි. මෙම වැඩසටහන යටතේ 220 කට ආසන්න පාරිභෝගික ද්‍රව්‍ය සඳහා සිල්ලර මිළ, ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදන සම්බන්ධ නිෂ්පාදන මිළ, වී ගොවිතැන සහ තේ, රබර් හා

පොල් වගාවන් සම්බන්ධ යෙදවුම් සඳහා සිල්ලර මිළ, වී ගොවිතැන, තේ, රබර් හා කුඩා පොල්වතු සහ ඉදිකිරීම් අංශයේ වැටුප් අනුපාත ආදී දත්ත රැස් කරනු ලැබේ. පාරිභෝගික භාණ්ඩ, කෘෂිකාර්මික යෙදවුම් ද්‍රව්‍ය සහ ශ්‍රමය ලබාගැනීමේ හැකියාව පිළිබඳ තොරතුරුද මේ යටතේ රැස් කරනු ලැබේ. දිවයිනේ තෝරාගත් මධ්‍යස්ථාන 100 කින් නිරන්තර පදනමක් යටතේ මෙම තොරතුරු රැස් කෙරේ. එකතු කරන ලද තොරතුරු ''මිළ සහ වැටුප් සංඛ්‍යාති- සිල්ලර, නිෂ්පාදන සහ යෙදවුම් මිළ සහ වැටුප්'' නමැති ප්‍රකාශනයෙහි පළකර ඇත.

### ආනයන ලිහිල් කිරීමේ වැඩසටහන පිළිබඳ සමීක්ෂණය

ආනයන සඳහා විවෘත කෙරෙන ණයවර ලිපි, ණයවර ලිපිවල සංශෝධනයන් හා ණයවර ලිපි සඳහා ලැබෙන බිල්පත් ඇසුරින් ලබාගත් තොරතුරු පදනම් කරගත් ආනයන ලිහිල් කිරීමේ වැඩසටහන පිළිබඳ සමීක්ෂණය තවදුරටත් ක්‍රියාත්මක කැරුණි. පාරිභෝගික භාණ්ඩ, අතරමැදි භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ වශයෙන්ද, අත්‍යවශ්‍ය නොවන භාණ්ඩද ඇතුළත්ව රාජ්‍ය අංශය, සංස්ථා අංශය හා පෞද්ගලික අංශය වශයෙන් අමතර වර්ගීකරණයක්ද සහිතව 1978 වසරේ වාර්ෂික වාර්තාවේ (96 පිටුව) ප්‍රකාශිත පරිදි සංඛ්‍යා සටහන් පිළියෙල කරනු ලැබේ. මෙම තොරතුරු නිත්‍ය පදනමක් මත අදළ අමාත්‍යාංශවලට සපයන ලදී.

### සංඛ්‍යාලේඛන ප්‍රකාශන

පහත සඳහන් ප්‍රකාශන 1981 වර්ෂය තුළ පළකර ඇත;

1. සමාජ ආර්ථික තොරතුරු පත්‍රිකාව — 1981
2. ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාති – වෙළුම 3 – අංක 1 සහ 2.
3. මිළ සහ වැටුප් සංඛ්‍යාති — 1980.
4. වී වගාකරන්නන්ට ණය සැපැයීම සහ ඔවුන්ගේ ණයගැතිභාවය පිළිබඳ සමීක්ෂණය -1976.

## රාජ්‍ය ණය

වර්ෂය තුළදී දළ රාජ්‍ය ණය ප්‍රමාණය රු. 1334,36,89,970 කින් වැඩි වූ අතර මුදල් වර්ෂය අවසානයේදී දළ රාජ්‍ය ණය ප්‍රමාණය රු. 6439,93,46,288 ක් ව පැවතියේය. දේශීය ණය ප්‍රමාණයෙහි වැඩිවීම රු. 644,83,43,670 ක් වූ අතර විදේශීය ණය ප්‍රමාණයෙහි වැඩිවීම රු. 689,53,46,300 ක් විය. දළ රාජ්‍ය ණය ප්‍රමාණයෙහි වැඩිවීම ප්‍රධාන වශයෙන්ම සැදුම් ලද්දේ භාණ්ඩාගාර බිල්පත්, රුපියල් ණය, පරිපාලනමය ණය ගැනුම් හා විදේශීය ණය ප්‍රමාණයන්හි වැඩිවීම් වලිනි. මහ බැංකු අත්තිකාරම් සහ බදු සංචිත සහතික, අඩුවීම් පෙන්නුම් කළේය. විශේෂ ණය නොවෙනස්ව පැවතුනි. රාජ්‍ය ණයෙහි සංයුතිය 2.10 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

### දේශීය ණය ගැනීම්

### (අ) රුපියල් ණය

1981 මුදල් වර්ෂය සඳහා වූ රජයේ අයවැය වැඩ පිළිවෙලට අනුව දේශීය බැංකු නොවන මූලයන්ගෙන් රුපියල් දශ ලක්ෂ 3,750 ක් ලබා ගැනීමට බලාපොරොත්තු වූ අතර 1980 මුදල් වර්ෂයේ දී දේශීය බැංකු නොවන මූලයන්ගෙන් එසේ ලබාගැනීමට බලාපොරොත්තු වූයේ රුපියල් දශ ලක්ෂ 3,100 ක් පමණි. කල් පිරීමේ කාලසීමාව අවුරුදු 3 ක් වූ මෙම රුපියල් ණය මුදල් සඳහා වර්ෂයකට සියයට 16 ක පොළියක් ගෙවනු ලැබිණ.

1981 වර්ෂය තුළදී රුපියල් ණය මාර්ගයෙන් ලබාගන්නා ලද සම්පූර්ණ මුදල රුපියල් දශ ලක්ෂ 2,512.3 ක් වූ අතර, 1981 වර්ෂය තුළ ආරම්භ කැරුණ එක් එක් රුපියල් ණය මුදලට වූ දයකවීම් පිළිබඳ විස්තර 2.11 සංඛ්‍යා සටහනෙහි දැක්වේ. සියලුම රුපියල් ණය ලබාගෙන ඇත්තේ 1980 අංක 58 දරන විසර්ජන පනත යටතේය.

## 2·10 සංඛ්‍යා සටහන

## රාජ්‍ය ණයෙහි සංයුතිය – 1980 සහ 1981

රුපියල්

| ශීර්ෂය | වර්ෂය අවසානයට ශේෂය | | වර්ෂය තුළ වැඩිවීම් හෝ අඩුවීම |
|---|---|---|---|
| | 31·12·1980 | 31·12·1981 | |
| 1. දේශීය ණය .. | 2937,88,45,694 | 3582,71,89,364 | + 644,83,43,670 |
| 1·1 දීර්ඝ කාලීන ණය .. | 1793,86,82,557 | 2035,98,19,233 | + 242,11,36,676 |
| අ. රුපියල් ණය .. | 1761,09,78,400 | 2002,54,28,500 | + 241,44,50,100 |
| ආ. පරිපාලන ණය ගැනීම් .. | 32,76,30,318 | 33,43,16,894 | + 66,86,576 |
| ඇ. ජාතික තිළිත පත් .. | 73,839 | 73,839 | – |
| 1 2 කෙටිකාලීන ණය .. | 1144,01,63,137 | 1546,73,70,131 | + 402,72,06,994 |
| අ. භාණ්ඩාගාර බිල්පත් .. | 980,00,00,000 | 1392,00,00,000 | + 412,00,00,000 |
| ආ. බදු සංචිත සහතික .. | 1,25,25,327 | 1,09,32,320 | – 15,93,007 |
| ඇ. මහ බැංකු අත්තිකාරම් .. | 131,92,00,000 | 122,80,00,000 | – 9,12,00,000 |
| ඈ. විශේෂ ණය .. | 30,84,37,810 | 30,84,37,811 | (1)* |
| 2. විදේශීය ණය .. | 2227,68,10,625 | 2917,21,56,925 | + 689,53,46,300 |
| 2·1 ව්‍යාපෘති ණය .. | 678,42,73,556 | 923,27,57,856 | + 244,84,84,300 |
| 2·2 ද්‍රව්‍යාධාර ණය .. | 1179,11,07,159 | 1405,48,15,511 | + 226,37,08,352 |
| 2·3 වෙනත් ණය .. | 370,14,29,910 | 588,45,83,558 | + 218,31,53,648 |
| මුළු රාජ්‍ය ණය .. | 5165,56,56,319 | 6499,93,46,289 | +1334,36,89,970 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* මෙය මුදල් ප්‍රමාණයේ වැඩිවීමක් ලෙස සැලකිය යුතු නොවේ. 1980. 12. 31 වැනි දිනට නොබේරා ඇති ශේෂය රු. 30,84,37,810 ක් නොව රු. 30,84,37,811 (එනම් රු. 30,84,37,810·63 ආසන්න රුපියලට ගණන් බැලීමේදී) විය යුතුව තිබිණි.

සංඛ්‍යා සටහනෙහි දැක්වෙන අන්දමට රුපියල් ණය සඳහා ප්‍රධාන වශයෙන් දායක වූයේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ඒකාබද්ධ ආයෝජන අරමුදල හා සේවක අර්ථසාධක අරමුදලත්ය. රුපියල් ණය වැඩ පිළිවෙලට අමතරව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මඟින් නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් සම්පූර්ණ වටිනාකම රුපියල් දශ ලක්ෂ 432.7 ක් වූ ණයකර පහක් ආරම්භ කරනු ලැබිණ. මේ සඳහා සේවක අර්ථසාධක අරමුදල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 66.0 හා රුපියල් දශ ලක්ෂ 56.7 කින් දායක වූ අතර ශේෂය ඒකාබද්ධ ආයෝජන අරමුදල වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ලබාගන්නා ලදී. 1980 වර්ෂයේ ක්‍රියාකාරිත්වය සමඟ සසඳා බලන විට, නිදන් අරමුදල හා සේවක අර්ථසාධක අරමුදල විසින් කරන ලද ආයෝජනයන්ගේ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ රක්ෂණ සංස්ථාව සිය දායකවීම් වල විශාල අඩුවීමක් පෙන්නුම් කර ඇත.

මෙම වර්ෂය තුළ රු. 9,78,70,400 ක රුපියල් ණය මුදල් හතරක් කල් පිරුණ අතර, අදාළ නිදන් අරමුදල්හි වූ මුදල් උපයෝගී කරගනිමින් මෙකී ණය මුදල් ආපසු ගෙවන ලදී. රු. 27,69,092 ක් වූ නිදන් අරමුදල්හි අතිරික්තය ඒකාබද්ධ අරමුදලට බැරකරන ලද අතර, රු. 1,08,81,909 ක ඌනතාවය අතිරේක නිදන් අරමුදලින් පියවන්නට යෙදිණ. 1981 වර්ෂය තුළ රුපියල් ණය මුදල වෙනුවෙන් වූ වගකීම්වල ශුද්ධ වැඩිවීම රු. 241,44,50,100 ක් විය. ආරම්භ කැරුණ ණය මුදල් හා ආපසු ගෙවුන ණය පිළිබඳ විස්තර 2.12 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

## 2 · 11 සංඛ්‍යා සටහන

**රාජ්‍ය දේශීය ණය වැඩපිළිවෙල – 1981– ශ්‍රී ලංකා ආණ්ඩුවේ රුපියල් ණයවලට දයකවීම් වර්ග කිරීම—16% ණය 1984**

| ආදයකවරු | 'අ' කාණ්ඩය | 'ආ' කාණ්ඩය | 'ඇ' කාණ්ඩය | 'ඈ' කාණ්ඩය | 'ඉ' කාණ්ඩය | 'ඊ' කාණ්ඩය | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|
| 1. අර්ධ–රාජ්‍ය ඉතිරි කිරීමේ ආයතන : | | | | | | | | |
| (අ) ජාතික ඉතිරි කිරීමේ බැංකුව .. | 55·02 | 14·00 | 23·00 | 167·40 | 26·60 | — | 286·02 | 11·39 |
| 2. භාරකාර, සුභසාධක, විශ්‍රාම සහ අර්ථසාධක අරමුදල් : | | | | | | | | |
| (අ) සේවක අර්ථසාධක අරමුදල .. .. | 182·50 | 194·77 | 232·50 | 115·75 | 289·28 | 6·75 | 1,021·55 | 40·66 |
| (ආ) වෙනත් .. .. .. | 1·00 | 1·02 | — | 40·00 | 10·43 | 2·60 | 55·05 | 2·19 |
| 3. ඒකාබද්ධ ආයෝජන අරමුදල .. .. | 230·53 | 190·52 | 243·16 | 175·91 | 171·80 | 2·70 | 1,014·62 | 40·39 |
| 4. ජාතික නිවාස නිදන් අරමුදල .. .. | ·95 | 1·04 | 1·26 | ·94 | 1·88 | ·27 | 6·34 | ·25 |
| 5. රක්ෂණ අරමුදල් : | | | | | | | | |
| (අ) රක්ෂණ සංස්ථාව .. .. | 30·00 | 10·00 | — | — | — | — | 40·00 | 1·59 |
| (ආ) රක්ෂණ සමාගම් .. .. | — | — | — | — | — | — | — | — |
| 6. දෙපාර්තමේන්තු සහ අනෙකුත් නිල අරමුදල් .. | — | — | — | — | — | — | — | — |
| 7. සමාජයන් සහ ආයතන .. .. | — | 0·02 | — | — | 0·01 | — | 0·03 | ... |
| 8. වෙළෙඳ බැංකු .. .. .. | — | 88·63 | — | — | — | — | 88·63 | 3·53 |
| 9. මධ්‍යම ආණ්ඩුව .. .. .. | — | — | 0·08 | — | — | — | 0·08 | ... |
| 10. පුද්ගලයන් .. .. .. | — | — | ... | — | — | — | ... | — |
| එකතුව .. | 500·00 | 500·00 | 500·00 | 500·00 | 500·00 | 12·32 | 2,512·32 | 100·00 |

## 2 · 12 සංඛ්‍යා සටහන

### 1981 වර්ෂය තුළ රුපියල් ණය ආපසු ගෙවීම්

| ණය මුදල | මුදල (රු.) | ඒ. ආ. අ. මගින් ආපසු ගෙවිය යුතු නි. අ. අ. ශේෂයෙහි වටිනාකම (රු.) | කල්පිරෙන දිනය | ඉදිරියට ගෙනා ආපසු ගෙවන දිනය | නි. අ. අ. හි පවතින හිඟය/ අතිරික්තය (රු.) |
|---|---|---|---|---|---|
| 1. 3¼% ණය 76–81 .. | 2,48,60,000 | 2,75,80,341·15 | 01·02·81 | — | 27,20,341·15† |
| 2. 4¼% ණය 81-85 .. | 4,47,02,800 | 3,76,43,224·98 | 01·11·85 | 01·11·81 | 70,59,575·02* |
| 3. 4¼% ණය 81 – 85 'බී' කාණ්ඩය .. | 2,50,00,000 | 2,11,77,666·13 | 01·12·85 | 01·12·81 | 38,22,333·87* |
| 4. 9% ඒකාබද්ධ ව්‍යාපාර වස්තු 1981 – 83 'සී කාණ්ඩය .. | 33,07,600 | 33,56,350·64 | 01·12·83 | 01·12·81 | 48,750·64† |
| එකතුව .. | 9,78,70,400 | 8,97,57,582·90 | | | 27,69,091·79†<br>108,81,908·89* |

† නිදන් අරමුදලේ ශේෂය.

* කල්පිරුන ණය මුදලට අදල නිදන් අරමුදලේ ඌනතාවය අතිරේක නිදන් අරමුදලින් පියවීම සඳහා

**(ආ) නිදන් අරමුදල්**

1981 මුදල් වර්ෂය අවසාන වන විට රුපියල් ණය බේරුම් කිරීම සඳහා ස්ථාපනය කරනලද නිදන් අරමුදල් වල වටිනාකම රු. 634,01,50,618 ක් විය. මෙය වර්ෂය තුළ රු. 146,35,22,955 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

මෙම වැඩිවීම පහත සඳහන් අන්දමට සෑදී ඇත:

| | | රු. |
|---|---|---|
| (1) 1981 වර්ෂය තුළ නිදන් අරමුදල් දයක දීමනා | .. | 96,43,30,608 |
| (2) ආයෝජන සඳහා වූ පොළිය | .. | 59,98,31,839 |
| | එකතුව : | 156,41,62,447 |

අඩු කළා :

| | රු. | |
|---|---|---|
| (1) 1981 වර්ෂය තුළ ආපසු ගෙවීම් සඳහා උපයෝගී කොට ගත් මුදල | 9,78,70,400 | |
| (2) 1981 වර්ෂය තුළ ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද අතිරික්තය | 27,69,092 | 10.06.39,492 |
| 1981 වර්ෂය තුළ ශුද්ධ වැඩිවීම | | 146 35 22,655 |

**(ඇ) පරිපාලන ණය ගැනීම්**

මහ බැංකුව මාර්ගයෙන් රජයට ලබා දී ඇති ණය මුදල් දෙකක් රාජ්‍ය ණය යටතේ කෙරෙන පරිපාලන ණය ගැනීම් වශයෙන් වර්ගීකරණය කර ඇත. වර්ෂය අවසානය වන විට පරිපාලන ණය ගැනීම් වෙනුවෙන් වූ සම්පූර්ණ රුපියල් වගකීම රු. 33,43,16,894 ක් විය.

**(ඈ) භාණ්ඩාගාර බිල්පත්**

රජයේ භාණ්ඩාගාර බිල්පත් අනුදත් සීමාව මෙම වර්ෂය තුළදී දෙවරක් ප්‍රතිශෝධනය කරන ලදී. එක් එක් ප්‍රතිශෝධනයෙන් පසුව අනුදත් සීමාව ප්‍රතිශෝධනය කැරුන දිනයද සහිතව පහතින් දක්වා ඇත.

| ප්‍රතිශෝධනය කරන ලද දිනය | වැඩිකරන ලද මුදල රුපියල් දශ ලක්ෂ | නව උපරිම සීමාව රුපියල් දශ ලක්ෂ |
|---|---|---|
| 1981·07·08 | 3,000 | 13,000 |
| 1981·11·24 | 5,000 | 18,000 |

වර්ෂය අවසානය වන විට නිකුත් කර, නොබේරා ඉතිරිව තිබූ භාණ්ඩාගාර බිල්පත්වල සම්පූර්ණ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 13,920 ක් වූ අතර, මෙය වර්ෂය තුළ රුපියල් දශ ලක්ෂ 4,120 ක වැඩිවීමක් පිළිබිඹු කරයි. බැංකු අංශය විසින් රුපියල් දශ ලක්ෂ 13,773 ක භාණ්ඩාගාර බිල්පත් උසුලනු ලැබූ අතර, මේ සඳහා මහ බැංකුවේ දායක වීම රුපියල් දශ ලක්ෂ 13,761 ක් විය. 1981 වර්ෂය අවසානයේදී භාණ්ඩාගාර බිල්පත් අයිතිය පිළිබඳ වර්ගීකරණයක් 2.13 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 13 වශයෙන් නොවෙනස්ව පැවැතිණි.

### 2·13 සංඛ්‍යා සටහන

### භාණ්ඩාගාර බිල්පත් වල හිමිකම – 1980 සහ 1981

| ශීර්ෂය | 1980 ප්‍රමාණය රු. දශ ලක්ෂ | 1981 ප්‍රමාණය රු. දශ ලක්ෂ | ප්‍රතිශතය |
|---|---|---|---|
| **බැංකු අංශය** | | | |
| 1· මහ බැංකුව .. | 9,604·5 | 13,760·8 | 98·9 |
| 2· වෙළෙඳ බැංකු .. | 8·0 | 12·7 | 0·1 |
| | 9.612·5 | 13,773·5 | 99·0 |
| **බැංකු නොවන අංශය** | | | |
| 1· නිදන් අරමුදල් .. | — | — | — |
| 2· අනෙකුත් අරමුදල් .. | 6·3 | 8·9 | 0·1 |
| 3· ඉතිරි කිරීමේ ආයතන .. | — | — | — |
| 4· රක්ෂණ සමාගම් .. | 4·0 | 2·7 | 0·0 |
| 5 අනිවාර්‍ය ඉතිරි කිරීමේ අරමුදල .. | 115·5 | 124·7 | 0·9 |
| 6· අනෙකුත් .. | 0·2 | 0·2 | 0·0 |
| | 126·0 | 136·5 | 1·0 |
| **රජයේ නියෝජිත ආයතන** | | | |
| 1· සේ. අ. අ. .. | 1·5 | 5·0 | 0·0 |
| 2· ජාතික ඉතිරි කිරීමේ බැංකුව .. | — | — | — |
| 3· ලංකා ඛනිජ වැලි සංස්ථාව .. | 60·0 | 5·0 | 0·0 |
| 4· ජාතික සංවර්ධන බැංකුව .. | — | — | — |
| 5· ටයර් සංස්ථාව .. | — | — | — |
| | 61·5 | 10·0 | 0·0 |
| මුළු එකතුව .. | 9,800·0 | 13,920·0 | 100·0 |

### (ඉ) බදු සංචිත සහතිකපත්

බදු සංචිත සහතිකපත් සම්බන්ධයෙන් වූ අනුදත් සීමාව මෙම වර්ෂය තුළ රුපියල් දශ ලක්ෂ 750 වශයෙන් නොවෙනස්ව පැවතිණි. 1981 වර්ෂය අවසානය දක්වා නිකුත් කරන ලද බදු සංචිත සහතිකපත් වල එකතුව රු. 73,77,43,600 ක් විය. මෙම ප්‍රමාණයෙන් රු. 72,68,11,280 ක් වටිනා සහතිකපත් බදු ගෙවීම සඳහා ඉදිරිපත් කර ඇති අතර, නො පියවා ඇති ප්‍රමාණය රු. 1,09,32,320 ක් විය. 1980 වර්ෂය අවසානයට පැවති මට්ටම හා සසඳා බැලීමේදී මෙය වර්ෂය තුළ රු. 15,93,007 ක අඩුවීමක් පිළිබිඹු කරයි.

### (ඊ) මහ බැංකු අත්තිකාරම්

මහ බැංකුව රජයට සැපයූ තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය වර්ෂය තුළදී රු. 9,12,00,000 කින් පහත වැටුන අතර, වර්ෂය අවසානයේදී නොබේරා තිබූ මුළු වගකීම් ප්‍රමාණය රු. 122,80,00,000 ක් විය.

### විදේශීය ණය

1981 වර්ෂය අවසාන වන විට පරිපාලන ණය හැරුන විට අනෙකුත් නොපියවූ විදේශීය ණයවල මුළු එකතුව රු. 2917,21,56,925 ක් විය. මෙය වර්ෂය තුළ රු. 689,53,46,300 ක වැඩිවීමක් පිළිබිඹු කෙළේය. විදේශීය ණය මුදල රු. 923,27,57,856 ක ව්‍යාපෘති ණය වලින්ද, රු. 1405,48,15,511 ක ද්‍රව්‍යාධාර ණය වලින්ද, රු. 588,45,83,558 ක අනෙකුත් ණය වලින්ද

සමන්විත විය. 1981 වර්ෂය තුළ විදේශීය ණය යටතේ වාර්තා වූ මුදහැරීම් රු. 548,66,93,337 ක් විය. රාජ්‍ය ණය යටතේ සේවා කරනු ලබන විදේශීය ණය වැඩි කොටසක් විවිධ විදේශීය ව්‍යවහාර මුදල්වලින් දක්වන ලද අතර, සෑම මාසයකම අවසානයේදී නොබේරා ඇති විදේශීය ව්‍යවහාර මුදල් ශේෂයන්, විනිමය අනුපාතිකයන්ගේ වෙනස්වීම් අනුව ප්‍රතිප්‍රමාණ කරනු ලැබේ. 1981 වර්ෂය තුළ කැරුන සියලුම විනිමය අනුපාතිකයන්ගේ සංශෝධන හේතුවෙන් ඇති වූ විදේශීය ණය වගකීම්වල ශුද්ධ වෙනස, විදේශීය ණය වගකීම රු. 216,26,49,159 කින් වැඩිකිරීමට සමත්විය. 1981 මුදල් වර්ෂය තුළදී විදේශීය ණය ගිවිසුම් විසි හතක් අත්සන් කරන ලදී. 1980 වර්ෂය තුළ ගිවිසුම් අත්සන් කරන ලද නමුදු විදේශීය ණය අටක් වෙනුවෙන් මුදල් ලබා ගැනීම ආරම්භ නොකරන ලදී.

**පොළී ගෙවීම්**

1981 වර්ෂය තුළ රාජ්‍ය ණය උදෙසා ගෙවන ලද පොළිය රු. 371,58,28,099 ක් විය. මෙය 1980 වර්ෂයට වඩා රු: 151,58,78,497 ක වැඩිවීමක් පිළිබිඹු කරයි. එක් එක් වර්ෂය යටතේ ගෙවන ලද පොළී පිළිබඳ විස්තර 2.14 සංඛ්‍යා සටහනෙහි දී ඇත.

**අර්ධ රාජ්‍ය ආයතන මගින් ණය ගැනීම්**

**(අ) ජාතික නිවාස ණයකර**

වර්ෂය තුළදී රු. 1,00,00,000 වටිනා ජාතික නිවාස ණයකර බේරුම් කරන ලදී. නිකුත් කරනු ලැබ, 1981 වර්ෂය අවසානය වන විට ඉතිරිව තිබූ ණයකරවල වටිනාකම රු. 6,60,00,000 ක් විය. මෙකී ණයකර බේරුම්කිරීම සඳහා පිහිටුවනු ලැබූ නිදන් අරමුදලේ දළ වෙළෙඳ වටිනාකම 1981 දෙසැම්බර් මස අවසානය වන විට රු. 3,60,19,024 ක් විය.

**(ආ) නාගරික සංවර්ධන අධිකාරියේ ණයකර**

1981 වර්ෂය තුළදී නාගරික සංවර්ධන අධිකාරියේ රුපියල් 43,26,60,000 ක් වටිනාකමෙන් යුත් ණයකර නිකුත් කරන ලදී. අවුරුදු 3 ක කාලයකින් කල් පිරෙන මෙම ණයකර සඳහා වාර්ෂිකව සියයට 16 ක පොළියක් ගෙවනු ලැබේ.

**(ඇ) රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකු ණයකර**

එකක් රුපියල් දශ ලක්ෂ 20 බැගින් වූ රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකු ණයකර නිකුතු තුනක් 1981 වර්ෂය තුළදී සිදු කෙරිණි. නිකුත් කරනු ලැබ 1981 වර්ෂය අවසානය වන විට ගෙවීමට ඉතිරිව තිබූ ණයකරවල වටිනාකම රුපියල් 11,72,50,000 ක් විය.

## විනිමය පාලනය

**ආනයන**

1. නැ. වි. ස. හෝ මී. ර. ගැ. වටිනාකම මත කැරෙන ආනයන සඳහා ගෙවීම පිණිස විනිමය පාලන දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියක් නොමැතිව, එහෙත් පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ණයවර ලිපි ඇරඹීමට, බලයලත් වෙළඳුනට අවසර දී ඇත:—

   (අ) ලංකා නැව් සංස්ථාවට අයත් වන හෝ එම සංස්ථාව විසින් කුලියට ගත් නැවක භාණ්ඩ නැව්ගත කිරීම.

   (ආ) සීමාසහිත එයාර් ලංකා සමාගමට අයත් ගුවන් යානයකින් භාණ්ඩ ගුවනින් ගෙන ඒම.

**අපනයන**

(i) 1981 මැයි 20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, පහත සඳහන් වර්ගවල රබර් අපනයනය කිරීම සඳහා, ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සමීක්ෂණ ආයතනයකින් හෝ ජාතික වෙළෙඳ මණ්ඩලයට අයත් සමීක්ෂක මණ්ඩලයක් මගින් හෝ නිකුත් කළ තත්ත්ව පාලන සහතිකයක් ඉදිරිපත් කළ යුතු විය:—

   (අ) ආර්. එස්. එස්. 4 වර්ගය

   (ආ) ආර්. එස්. එස්. 5 වර්ගය

(ii) ලංකාවේ නිෂ්පාදිත ස්වර්ණාභරණ/මැණික් එබ්බ වූ ස්වර්ණාභරණ, පනවා ඇති කොන්දේසිවලට යටත්ව අපනයනය කිරීම සඳහා වන අයදුම්පත් 1981 අගෝස්තු 24 වැනි දින සිට ඔවුනටම අනුමත කළ හැකි බව බලය ලත් වෙළඳුනට දන්වන ලදී.

**අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ක්‍රමය**

අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ක්‍රමයේ දැනට පවතින ව්‍යවස්ථා පහත දැක්වෙන පරිදි සංශෝධනය කර ඇත:—

(i) විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයන්ටත්, විදේශයක සිට ශ්‍රී ලංකාවට ආපසු පැමිණි පුද්ගලයන්ටත් එසේ පැමිණ දින 90 ක කාලසීමාවක් ඇතුළතදී අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ඇරඹීමට දැන් පිළිවන.

(ii) මෙකී ගිණුම් හවුල් ගිණුම් ලෙස පවත්වා ගෙන යා හැකිය. එහෙත් සියලුම හවුල් කරුවන් ඉහත (i) හි දැක්වා ඇති කොන්දේසිවලට අනුකූල විය යුතුය.

(iii) මෙම ගිණුම් ඕනෑම අවස්ථාවකදී වසා දැමීමට ගිණුම් හිමියාට පිළිවන. එසේ වුවද, ගිණුම් හිමියා ශ්‍රී ලංකාවේ නිත්‍ය වාසයට පැමිණ වසර 10 ක කාලසීමාවක් ඉක්මවීමට පෙර ගිණුම වසා දැමිය යුතුය.

**නේවාසික ආගන්තුක ක්‍රමය**

මහ කොළඹ ආර්ථික කොමිෂම විසින් අනුමත කරන ලද ව්‍යාපෘතිවල ආයෝජනය කිරීම සඳහා විදේශීය අරමුදල් ගෙන ඒමට මුදල් සහ ක්‍රම සම්පාදන ඇමතිතුමා විසින් නේවාසික ආගන්තුකයනට අවසර දී ඇත.

**ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා නියෝජිත කොමිස්**

''නිදහස්ව ආපසු යැවෙන'' කොන්දේසි මත ගෙන එන භාණ්ඩ හැර ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සියලුම භාණ්ඩ සඳහා 1981.02.01 වැනි දින සිට, සියයට 2 1/2 ක නියෝජිත කොමිස් මුදලක් ලබා ගැනීමට කටයුතු කළ යුතුයැයි නැව් නියෝජිතයනට දන්වන ලදී.

**''ප්‍රතිනැව්ගත කළ නැව් බඩු ඇසුරුම්'' සඳහා නියෝජිත කොමිස්**

ප්‍රතිනැව්ගත කළ නැව් බඩු ඇසුරුම් ගොඩබෑම සහ පැටවීම සඳහා පහත සඳහන් පරිදි නියෝජිත කොමිස් මුදල් ලබා ගැනීමට කටයුතු සළසා ගත යුතුයැයි නැව් නියෝජිතයනට දන්වා ඇත :—

(අ) ප්‍රතිනැව්ගත කළ නැව් බඩු ඇසුරුමක් සඳහා එක්සත් ජනපද ඩොලර් 15 ක මුදලක් හෝ එකී ඇසුරුමෙහි මුළු ගැල් කුලියෙන් සියයට එකක් යන දෙකින් වැඩි මුදල.

(ආ) ප්‍රතිනැව්ගත කළ හිස් නැව් බඩු ඇසුරුමක් සඳහා එක්සත් ජනපද ඩොලර් 5 ක අවම මුදලක්.

**විදේශීය ව්‍යවහාර මුදල් මාරු කිරීම**

ශ්‍රී ලංකාවේ පුද්ගලයන් විසින් ඉදිරිපත් කරනු ලබන, එක්සත් ජනපද ඩොලර් 500 ක් හෝ ඊට සමාන වෙනත් විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණයක වටිනාකමැති ආමුඛ ප්‍රේෂණ, සංචාරක චෙක්පත් සහ වෙනත් වර්ගවල විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු, එකී විදේශ විනිමය ලබාගත් කාර්යය සහ ලැබුන ආකාරය පිළිබඳ තොරතුරු ආදයකගෙන් නොවිමසාම මෙරට ව්‍යවහාර මුදලට මාරු කිරීමට බලයලත් වෙළඳුනට අවසර දී ඇත.

## සේවක අර්ථසාධක අරමුදල

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව මඟින්, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ, ගෙවනු ලබන සියලුම මුදල්, එනම්, දායක දීමනා, අධිභාර මුදල් හා අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායම් එකතු කිරීම සහ පනතේ 5 වැනි වගන්තිය ප්‍රකාර මෙම මුදල් සම්බන්ධයෙන් අනෙකුත් කාර්‍යයන් ඉටු කිරීම ද තොකඩවා කරගෙන ගියේය. 1981 වර්ෂය තුළ එහි මෙහෙයවුම් කටයුතු පිළිබඳ සංක්ෂිප්ත සටහනක් පහත දැක්වා ඇත.

**දායක මුදල්**

1981 වර්ෂය තුළ අරමුදලට ලැබුණු දායක දීමනා ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 895.7 ක් වූ අතර, 1980 වර්ෂයේ එය රුපියල් දශ ලක්ෂ 741.0 ක් විය. මෙය කලින් වර්ෂයේ ලැබූ දායක දීමනා ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 154.7 ක හෙවත් සියයට 20·9 ක වැඩි වීමකි.

## 2 · 14 සංඛ්‍යා සටහන

### රාජ්‍ය ණය මත පොළී ගෙවීම්[1]

රුපියල්

| ණය වර්ගය | 1977 | 1978 | 1979 | 1980 | 1981 |
|---|---|---|---|---|---|
| අ. දේශීය ණය : | | | | | |
| 1. රුපියල් ණය .. .. .. | 68,96,39,915 | 83,99,29,008 | 102,86,78,106 | 133,02,88,692 | 169,42,38,933 |
| 2. පරිපාලන ණය ගැනීම්[2] .. .. | 3,17,47,277 | 3,98,89,369 | 2,75,52,069 | 1,53,44,501 | 29,30,074 |
| 3. භාණ්ඩාගාර බිල්පත් .. .. | 8,88,47,415 | 17,39,19,871 | 22,00,50,000 | 44,12,82,750 | 130,55,25,000 |
| 4. බදු සංචිත සහතිකපත්.. .. .. | 10,22,824 | 9,86,391 | 6,53,073 | 5,04,876 | 2,38,010 |
| උප එකතුව .. | 81,12,57,431 | 105,47,24,639 | 127,69,33,248 | 178,74,20,819 | 300,29,32,017 |
| ආ. විදේශීය ණය : | | | | | |
| 1. විදේශීය ණය ගැනීම් .. .. .. | 13,62,07,376 | 28,50,31,967 | 35,66,80,312 | 41,25,28,783 | 71,28,96,082 |
| අ සහ ආ මුළු එකතුව .. | 94,74,64,807 | 133,97,56,606 | 163,36,13,560 | 219,99,49,602 | 371,58,28,099 |
| විදේශීය ණය මත විවිධ ගෙවීම් .. .. | 5,46,22,469 | — | — | — | — |

1. භාණ්ඩාගාරය විසින් සේවා කරන ලද තාවකාලික රුපියල් ණය ගැනීම් හා කෙටි කාලීන විදේශීය ණය සඳහා කරනු ලබන පොළී ගෙවීම් හැර.
2. මෙය ඒ.එල්. 556 දරන කේ. එෆ්. ඩබ්ලිව් ණය සහ ඉරාන ණය නියෝජනය කරයි. 1980 අවසානයේදී ඉරාන ණය සම්පූර්ණයෙන් ගෙවා නිම කරන ලදී.

1980 වර්ෂයේදී සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු වූ අවම දායක දීමනා අනුපාතිකය සේවකයාගේ දායක දීමනා වශයෙන් සේවකයාගේ මුළු ඉපැයීම් වලින් සියයට 6 ක් සහ සේවායයාගේ දායක දීමනා වශයෙන් සේවකයාගේ මුළු ඉපැයීම්වලින් සියයට 9 ක්ද වශයෙන් සේවකයාගේ මුළු ඉපැයීම් වලින් සියයට 15 ක් විය. 1981 වර්ෂයේදී අවම දායක දීමනා සේවකයාගෙන් සියයට 8 ක් හා සේවායයාගෙන් සියයට 12 ක් වශයෙන් සේවකයාගේ මුළු ඉපැයීම් වලින් සියයට 20 ක් වන ලෙස වැඩි කරන ලදී. දායක දීමනා ප්‍රමාණයෙහි සියයට 33 1/3 ක වැඩිවීමක් පිළිබිඹු වන පරිදි, දායක දීමනා අනුපාතිකය සියයට 15 සිට සියයට 20 දක්වා වැඩි කිරීමෙන්, 1981 වර්ෂයේ මුළු දායක දීමනා ප්‍රමාණයෙහිද සැළකිය යුතු වැඩිවීමක් වෙතැයි අපේක්ෂා කරන ලදී.

1980 සහ 1981 වර්ෂවල ජනවාරි සිට දෙසැම්බර් දක්වා ලැබුණු දායක දීමනා පිළිබඳ සංසන්දනාත්මක විස්තරයක් පහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1980 වර්ෂය සමඟ සසඳන කල, දායක දීමනා වැඩිවීමේ ප්‍රතිශතය සියයට 40.6 ක් වූ 1981 අප්‍රේල් මාසයේ හැර 1981 පෙබරවාරි සහ ජූලි අතර වූ අනෙක් මාසවල දායක දීමනා වැඩිවීමේ ප්‍රතිශතය සියයට 33 1/2 ට අඩු බව මෙම සටහනින් පෙනේ. එහෙත් 1981 වර්ෂයේ අගෝස්තු සිට ඔක්තෝබර් දක්වා ලැබුණු දායක දීමනා, 1980 වර්ෂයේ අදාළ මට්ටමට වඩා අවම වශයෙන් සියයට 30 කින් වැඩිවී ඇත. 1981 නොවැම්බර් සහ දෙසැම්බර් කාලය තුළ ලැබුණු දායක දීමනා යළිත් සුළු වශයෙන් අඩුවී ඇත.

**2·15 සංඛ්‍යා සටහන**

**මාසිකව ලැබුණු දායක දීමනා පිළිබඳ සංසන්දනාත්මක ප්‍රකාශයක් (අධිභාර ඇතුළුව)**

| මාසය | 1980 (රුපියල්වලින්) | 1981 (රුපියල්වලින්) | වර්ධක ප්‍රතිශතය |
|---|---|---|---|
| ජනවාරි .. .. .. | 5,99,19,005 | 8,88,61,606 | 48·30 |
| පෙබරවාරි .. .. .. | 6,40,82,536 | 7,18,64,998 | 12·14 |
| මාර්තු .. .. .. | 5,96,70,071 | 7,24,91,149 | 21·48 |
| අප්‍රේල් .. .. .. | 5,26,83,439 | 7,40,75,267 | 40·60 |
| මැයි .. .. .. | 6,40,26,454 | 6,71,02,044 | 4·80 |
| ජූනි .. .. .. | 6,35,75,370 | 7,37,25,633 | 15·96 |
| ජූලි .. .. .. | 6,79,96,083 | 7,34,69,813 | 8·05 |
| අගෝස්තු .. .. .. | 6,04,00,233 | 8,32,04,251 | 37·75 |
| සැප්තැම්බර් .. .. .. | 6,15,44,179 | 8,03,45,928 | 30·54 |
| ඔක්තෝබර් .. .. .. | 6,25,43,157 | 8,16,27,273 | 30·51 |
| නොවැම්බර් .. .. .. | 6,17,00, 43 | 7,59,18,187 | 23·04 |
| දෙසැම්බර් .. .. .. | 7,29,82,042 | 8,03,85,316 | 10·14 |

**සාමාජිකයින්ගේ ශේෂ**

1981 අවසානයේදී සාමාජිකයින්ගේ ශේෂයන් රුපියල් දශ ලක්ෂ 5,596.6 ක්ව පැවැති අතර, එය 1980 වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 976.2 ක නැතහොත් සියයට 21.1 ක වැඩි වීමකි.

**ආයෝජන**

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී අරමුදල විසින්, රජයේ සුරැකුම්පත්වල සහ නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද ණයකරවල රුපියල් දශලක්ෂ 1,124.0 ක මුදලක් ආයෝජනය කරන ලදී. 1980 වර්ෂයේදී ආයෝජනය කළ මුදල රුපියල් දශ ලක්ෂ 1,022.5 ක් විය. මෙය 1980 මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 101.5 ක හෙවත් සියයට 9.9 ක වැඩිවීමකි. 1981 අවසානයේදී සේවක අර්ථසාධක අරමුදල සතු මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් කෝටි 590 ක්ව පැවතිණි.

සේවක අර්ථසාධක අරමුදලේ මුදල් ආයෝජනය සාධක කිහිපයක් මත රඳා පවතී. මාස්පතා ලැබෙන දායක දීමනා ප්‍රමාණය මෙහිලා ප්‍රධාන වෙයි. මාසික දායක දීමනා පරිමාණය රඳා පවත්නේ සේවායතන ගණන, වේතන අනුපාතික, සේවායා හා සේවකයා විසින් ගෙවනු ලබන දායක දීමනා ප්‍රතිශතය සහ කම්කරු කොමසාරිස් විසින් සේවක අර්ථසාධක අරමුදල් පනතෙහි විධිවිධානයන්, ක්‍රියාත්මක කරනු ලබන ආකාරය අනුවය. කිසියම් නිශ්චිත කාල සීමාවක් තුළ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට සේවක අර්ථසාධක අරමුදල්

දෙපාර්තමේන්තුවට හැකිවනුයේ, ලැබුණු දයක මුදල් ප්‍රමාණය, ඉකුත් ආයෝජනවල කල්පිරුණු අය ලැබීම් සහ ආයෝජන ආදයම් වලින් සාමාජිකයනට ගෙවන ලද මුළු ප්‍රතිලාභ ප්‍රමාණය සහ අරමුදලේ පරිපාලන වියදම් අඩු කළ විට ඉතිරිවන මුදල් ප්‍රමාණයයි.

**ආයෝජන ආදයම**

1981 වර්ෂයේදී අරමුදලේ ආයෝජන ආදයම රුපියල් දශ ලක්ෂ 486.2 ක් වූ අතර, 1980 වර්ෂයේ එය රුපියල් දශ ලක්ෂ 351.6 ක් විය. කලින් වර්ෂයේ වැඩිවීම වූ රුපියල් දශ ලක්ෂ 82.8 හෙවත් සියයට 30.8 හා සසඳන කල මෙය රුපියල් දශ ලක්ෂ 134.6 ක් හෙවත් සියයට 38.2 ක වැඩිවීමකි. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අරමුදල වෙත ලැබුණු දයක දීමනා පරිමාව වැඩිවීම සහ කලින් කරන ලද ආයෝජන වලින් ඉපැයූ ආදයම ප්‍රති - ආයෝජනය කිරීමය. තවද රුපියල් ණය සඳහා ඉහළ පොළී අනුපාතිකයන් ලැබීමද එයට හේතු විය.

**ප්‍රතිලාභ ගෙවීම්**

1981 වර්ෂයේ සාමාජිකයනට, සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ වශයෙන් ආපසු ගෙවන ලද මුදල රුපියල් දශ ලක්ෂ 300.4 ක් විය. 1980 දී එය රුපියල් දශ ලක්ෂ 205.4 ක් විය. 1980 වර්ෂය සමඟ සසඳන විට මෙය, රුපියල් දශ ලක්ෂ 95.0 ක හෙවත් සියයට 46.3 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. 1981 වර්ෂයේදී ගෙවූ ප්‍රතිලාභ අයදුම්පත් සංඛ්‍යාව 61,969 ක් වූ අතර, 1980 වර්ෂයේදී එය 50,968 ක් විය. පෙරළා සියරට ගිය ඉන්දියානු සම්භවය ඇති පුද්ගලයන්ගේ අයදුම් 24,630 ක් ද ඊට ඇතුළත් විය.

පෙරළා සියරට යන ඉන්දියානු සම්භවය ඇති පුද්ගලයනට සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ස්වේච්ඡා පදනමක් මත ආපසු ගෙවීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් 1976 දී නව ක්‍රියා මාර්ගයක් හඳුන්වා දෙන ලදී. මේ යටතේ, තැපැල් පැවරුම් මඟින් ඉන්දියාවට අරමුදල් යැවීම සඳහා පමණක් මුදල් කරගත හැකි ආකාරයෙන්, ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, චෙක්පත් මඟින් ගෙවනු ලැබේ. මෙම පිළිවෙත යටතේ පෙරළා සියරට යන්නන්හට ඔවුන්ගේ සේවක අර්ථ සාධක අරමුදල් ප්‍රතිලාභ හැකි කෙටිම කාලසීමාවක් තුළදී ගෙවනු ලබන බවට සහතික කෙරේ.

1980—1981 කාලච්ඡේදය තුළ දී සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින් ආපසු ගෙවූ ප්‍රතිලාභ අයදුම් පත් සංඛ්‍යාව සැලකිය යුතු පරිදි වැඩිවී ඇති බව පෙනී යයි. එසේම ගෙවනු ලැබූ මුදල් ප්‍රමාණය ද සැලකිය යුතු පරිදි වැඩි වී ඇත. ප්‍රතිලාභ ආපසු ගෙවීමේ ප්‍රමාණය වැඩි වීමේ උපනතියට, පෙරළා සිය රට යන ඉන්දියානු සම්භවය ඇති පුද්ගලයන්ගෙන් ලැබුන අයදුම්පත් සංඛ්‍යාව වැඩිවීමත්, එක් එක් පුද්ගලයා ලැබූ ප්‍රතිලාභ ප්‍රමාණය වැඩිවීමත් හේතුවන්නට ඇත.

**සාමාජිකයින්ගේ ශේෂ සඳහා පොළිය**

සේවක අර්ථසාධක අරමුදල විසින්, සෑම වර්ෂයකම අවසානයේදී ඇති සාමාජික ශේෂයන් මත පොළියක්, අරමුදලේ ආයෝජන ආදයමෙන් ගෙවිය යුතු වේ. 1980 වර්ෂයේ සාමාජික ශේෂය සඳහා ගෙවිය යුතු වාර්ෂික පොළී අනුපාතිකය සියයට 8 ක් වූ අතර, 1981 වර්ෂයේදී එය සියයට 8.5 දක්වා වැඩි කැරිණි.

වර්ෂය අවසානයේදී සමාජිකයිනගේ බැරට ඇති ශේෂයන් මත පොළිය ගෙවනු ලබන අතර, ඊට පසුව එක්වන මුළු මුදලටම පොළිය එකතු වේ. එසේම වර්ෂය අවසානයේ සාමාජිකයාගේ බැරට පවතින ශේෂය මත එම ශේෂයෙන් වර්තන වර්ෂයේ දයක දීමනා නියෝජනය කෙරෙන කිසියම් කොටසක් සාමාජිකයාගේ බැරට ලැබුණු දිනය කෙදිනක වුව ද මුළු අවුරුද්දකටම පොළිය ගෙවනු ලැබේ. උදහරණයක් වශයෙන්, ජනවාරි මාසයේ ලැබුණු දයක දීමනා වලට ගෙවනු ලබන පරිදිම එම වර්ෂයේ දෙසැම්බර් මාසයේ දී ලැබෙන දයක මුදල් වෙනුවෙන් ද, සම්පූර්ණ වර්ෂය සඳහාම පොළිය ගෙවනු ලැබේ. එබැවින් ක්‍රියාත්මක වන පොළී අනුපාතිකය සියයට 8.5 කට වඩා එක්තරා ප්‍රමාණයකින් වැඩි වේ.

**දෙපාර්තමේන්තුවේ පරිපාලනය**

(අ) සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ දී, අත්හද බැලීමේ යෝජනා ක්‍රමයක් වශයෙන් නම් සහ සාමාජික අංක සහිත පූර්ව මුද්‍රිත 'සී' වාර්තා හඳුන්වා දෙනු ලැබීය. ඒ අනුව, හම්බන්තොට, මාතර, ගාල්ල, නුවරඑළිය, මාතලේ, ත්‍රිකුණාමලය, පොළොන්නරුව, මන්නාරම, වවුනියාව, අනුරාධපුරය, යාපනය, මඩකලපුව, හලාවත පුත්තලම, මහනුවර, ගම්පහ සහ අම්පාරේ යන දිස්ත්‍රික්ක මෙම යෝජනා ක්‍රමය යටතට ගෙන ඇති අතර, ළඟදීම එය ඉතිරි දිස්ත්‍රික්ක තුළ ද ව්‍යාප්ත කැරෙනු ඇත.

(ආ) සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් ඉක්මන් කරනු සඳහා පිළිවෙතක් සකස් කරනු ලැබ ඒ අනුව ක්‍රියාකිරීමට පියවර ගෙන ඇත.

(ඇ) ප්‍රතිලාභ ගෙවීමේදී කිසියම් වැඩිපුර ගෙවීමක් මග හැරවීම සඳහා පරිපාලනමය පිළිවෙත් යොදවා ඇත.

(ඈ) සමාලෝචනයට භාජනය වූ වර්ෂයේ දී, සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, හිමිකම් පාන අයගේ ඉතිරි කිරීම් හෝ ජංගම ගිණුම්වලට කෙළින්ම බැර කිරීමේ නව පිළිවෙතක වැඩ කටයුතු, කම්කරු කොමසාරිස්ගේ ද අනුමැතිය ඇතිව අවසන් කිරීමට සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවට හැකිවිය. මෙම පිළිවෙත ස්වේච්ඡා පදනමක් මත දැන් ක්‍රියාත්මක වේ.

(ඉ) ප්‍රධාන ලිපිගොනු, වාර්ෂික ප්‍රකාශන ලැයිස්තුගත කිරීම් සහ කේවළ සේවායතන ලෙජරයන් සූක්ෂම සේයා පටි ගත කිරීම කළයුතු යයි කළමනාකාරිත්ව විගණන අධ්‍යක්ෂ ගෙන් ඉල්ලා සිටින ලදී.

(ඊ) කම්කරු කොමසාරිස්ගේ ඉල්ලීම පරිදි ගම්පහ, අම්පාර සහ මුලතිව් යනුවෙන් සේවක අර්ථසාධක අරමුදල් නව කලාප තුනක් පිහිටුවීමට පියවර ගන්නා ලදී.

අරමුදලේ මෙහෙයවුම් පිළිබඳව දැනට ඇති දත්තයන් මත සැකසුනු සංසන්දනාත්මක ප්‍රකාශයක් පහත දක්වා ඇත.

**2 · 16 සංඛ්‍යා සටහන**

**සේ.අ.අ. සංඛ්‍යා – 1980-1981**

| | | 1980 | 1981 |
|---|---|---|---|
| (1) | ලැබුණු දායක දීමනා (රුපි.) .. | 74,1,0,32,542* | 89,5,6,77,610* |
| (2) | ආයෝජන (රුපි.) .. | 1,02,2,5,00,194** | 1,12,3,9,71,335** |
| (3) | ආයෝජන වලින් ලද ආදායම (රුපි ) .. | 35,1,6,08 138 | 43,6,1,82,828 |
| (4) | ප්‍රතිලාභ ආපසු ගෙවීම් (රුපි.) .. | 20,5,3,55,353 | 30,0,3,58,747 |
| (5) | ආපසු ගෙවුම් සංඛ්‍යාව .. | 50,968 | 61,969 |
| (6) | පොළී අනුපාතිකය (%) .. | 8·0 | 8·5 |
| (7) | සාමාජික ශේෂය සඳහා පොළී (රුපි.) .. | 39,2,7,28,706 | 53,1,6,72,296 |

* අඩුවැඩි දායක මුදල් ගිණුමට බැරකළ දායක මුදල් හැර

** කල්පිරි අය ලැබීම් රජයේ සුරැකුම්පත්වල ප්‍රති – ආයෝජනයන් ඇතුළුව.

## ආයතන කටයුතු

කාර්‍ය මණ්ඩලය බඳවා ගැනීම, උසස් කිරීම, කාර්‍යය අගැයීම පිළිබඳ සියළු කටයුතු විනයානුකූල කටයුතු සහ කාර්‍ය මණ්ඩලයට අදළ කටයුතු වල ආයතන දෙපාර්තමේන්තුව තවදුරටත් නිරත වූයේය.

**සේවයට බඳවා ගැනීම**

වර්ෂය තුළ පහත දැක්වෙන අළුත් තනතුරුවලට සේවකයන් බඳවා ගන්නා ලදී:

(i) ආරක්ෂක සේවා පාලක — මාණ්ඩලික පංතිය 3 වැනි ශ්‍රේණිය. (ආරක්ෂක සේවය භාරව සිටීමට)

(ii) ලිපි සම්පාදක — අර්ධකාලීන කොන්ත්‍රාත් පදනමක් මත

## දත්ත සැකසුම්

1981.12.01 වැනි දින දත්ත සැකසුම් අංශය බැංකුවේ දෙපාර්තමේන්තුවක තත්ත්වයට උසස් කරන ලදී. දත්ත සැකසුම් දෙපාර්තමේන්තුව ක්‍රම හා වැඩ සටහන් අංශය හා ක්‍රියා කිරීම් අංශය වශයෙන් අභ්‍යන්තර ව සංවිධානය කර ඇත.

1981 වර්ෂයේදී මහ බැංකුවේ අංශ කීපයක පරිගණක කටයුතු මෙම දෙපාර්තමේන්තුව විසින් කරන ලදී. මේවා ප්‍රධාන වශයෙන් මෙසේය:

(අ) සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ ගණන් තැබීමේ ක්‍රමය,
(ආ) ශ්‍රී ලංකාවේ ගිණුම් ශේෂයන්,
(ඇ) ශ්‍රී ලංකාවට ලැබෙන පෞද්ගලික විවිධ ආමුඛ ප්‍රේෂණ ලැයිස්තුගත කිරීම,
(ඈ) රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ දේශීය හා විදේශීය ණය,
(ඉ) බැංකු කටයුතු දෙපාර්තමේන්තුවේ කෙටි හා දිගු කාලීන ණය,
(ඊ) ආනයන ක්‍රමය සඳහා උපදෙස් දීම,
(උ) සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ දත්ත රැස්කිරීමේ සමීක්ෂණය,
(ඌ) සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් කරන ලද පාරිභෝගික මුදල් සමීක්ෂණය,
(එ) සංඛ්‍යාන හා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තු විසින් කලින් කලට කරන ලද සංඛ්‍යාලේඛන සමීක්ෂණ,
(ඒ) මහ බැංකුවේ වැටුප් ලේඛනය හා විශ්‍රාම ප්‍රතිලාභ.

මීට අමතරව දෙපාර්තමේන්තුවේ වැඩ සටහන් සම්පාදක සේවය හා පරිගණක කාලය ජාතික ඉතිරිකිරීමේ බැංකුවට, පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ කොමසාරිස්ට හා ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවට සපයන ලදී.

1981 වර්ෂයේදී මහ බැංකුවේ රාජ්‍ය ගිණුම් ශාඛාවේ වැඩ කටයුතු පරිගණක යන්ත්‍ර මාර්ගයෙන් කිරීම සැළසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව භාර ගත්තේය. මෙම වැඩ පිළිවෙල මඟින් දෛනික වාර්තා වර්ග 12 ක් නිකුත් කැරෙන පරිද්දෙන් එය සැළසුම් කර ඇත.

## පරිශ්‍ර

පරිශ්‍ර දෙපාර්තමේන්තුවේ මූලික කටයුත්ත වනුයේ මහ බැංකු නිළධාරීන්ට සිය රාජකාරි කටයුතු ඉටු කිරීමට ප්‍රසන්න පරිසරයක් සැලසීම හා එය පවත්වාගෙන යාමත්ය. මෙම අරමුණ ඉටුකිරීමෙහි ලා විශේෂ වශයෙන්, ජලය සැපයීම, වායු සමීකරණය පවත්වාගෙන යෑම, විදුලි සෝපාන පවත්වාගෙන යෑම, හදිසි විදුලි බලය සැපයීම, පවිත්‍ර කිරීම, බැංකු පරිශ්‍රය අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම, ලී බඩු හා සවිකිරීම් අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම වැනි සිය සේවාවන් දෙපාර්තමේන්තුව මඟින් නොකඩවා පවත්වාගෙන යන ලදී. මේ කාර්යයට අමතරව 1981 වර්ෂයේදී දෙපාර්තමේන්තුව පහත දැක්වෙන ව්‍යාපෘතිවල කටයුතු කිරීමෙහි ද නිරත විය.

(i) මාතර ප්‍රාදේශීය කාර්යාලය,
(ii) අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය,
(iii) ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය,
(iv) නව මහ බැංකු ගොඩනැගිලි ව්‍යාපෘතිය,
(v) බැංකුවට අතිරේක බිම් ඉඩකඩ සොයා දීම, සහ
(vi) බැංකුවේ වාහන සංඛ්‍යාවේ ප්‍රගතිය සැලසීම හා ඒවා නඩත්තු කිරීම.

## ප්‍රවෘත්ති

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පිහිටුවන ලද්දේ 1980 අගෝස්තු මාසයේදීය. එහි කාර්යයන් වනුයේ:

(i) කාර්යක්ෂම පුස්තකාල සේවයක් ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, එමඟින් විවිධ ප්‍රකාශන, සඟරා හා ප්‍රවෘත්ති පත්‍රවලින් ප්‍රවෘත්ති තෝරා උපුටා ගෙන ඒවා බැංකු නිළධාරීන් හා අනෙකුත් අවශ්‍ය කරන අයවලුන් අතර සංසරණය කරනු ලැබීම,

(ii) බැංකු ප්‍රකාශන විකිණීම හා ඒවා බෙදහැරීම භාරව ක්‍රියා කිරීම,

(iii) ප්‍රවෘත්ති පත්‍රවලට හා ගුවන් විදුලියට සහ මහජනතාවට තොරතුරු සැපයීම භාරව සිටීම; එසේම මහ බැංකුව විසින් කලින් කලට පවත්වන්නාවූ සම්මේලන, සාකච්ඡා සමුළු, වැඩමුළු ආදිය සඳහා කටයුතු සූදානම් කිරීම.

සමාලෝචනයට භාජනය වන්නාවූ වර්ෂයේදී මහ බැංකුව විසින් භාරගත් වැඩ පිළිබඳව ප්‍රචාරක කටයුතු කිරීමද, පුවත්පත් සම්මේලන පැවැත්වීම හා ප්‍රවෘත්ති සැපයීමද, පුවත්පත්වලට හා මහජනයාට දත්ත හා වෙනත් තොරතුරු සැපයීමද, දෙපාර්තමේන්තුව විසින් කරන ලදී. මහ බැංකුවේ අනුග්‍රහය ඇතිව අන්තර් ජාතික සම්මේලන දෙකක් 1981 වර්ෂයේදී පවත්වන ලදී. ඒවා නම් 1981 ජනවාරි මාසයේදී පැවැත්වූ අග්නිදිග ආසියානු අධිපතිවරුන්ගේ 16 වැනි සම්මේලනය හා 1981 මාර්තු මාසයේදී පැවැත්වූ ආසියානු නිෂ්කාශණ සංගමයේ 9 වැනි මණ්ඩල රැස්වීමත්ය. දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය සියළුම කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කරන ලදී. වර්ෂය තුළදී කොළඹින් බැහැර වූ සාකච්ඡා සමුළුවක්ද දෙපාර්තමේන්තුව සංවිධානය කළේය. මෙය මහ බැංකුව විසින් පවත්වන ලද ඒ ආකාරයේ පළමුවැනි සාකච්ඡා සමුළුව විය. මෙම සාකච්ඡා සමුළුව මොණරාගල පැවැත්වූ අතර එහි පරමාර්ථය වූයේ බැංකු කරුවන් හා ස්වයං කෘෂිකර්ම හා කර්මාන්ත ව්‍යාපෘති ආරම්භ කිරීමට බැංකුවල උපකාරය අවශ්‍ය වන්නාවූ පුද්ගලයින් අතර වඩාත් සමීප සම්බන්ධයක් ඇති කිරීමයි.

මාසික ප්‍රවෘත්ති සමීක්ෂණයක් ප්‍රකාශයට පත්කිරීම, එය ප්‍රයෝජන වනු ඇතැයි අදහස් කළාවූ පුද්ගලයින් වන, නීති සම්පාදකයින්, පෞද්ගලික අංශයේ විධායක නිළධාරීන්, රජයේ නිළධාරීන් හා ආර්ථික කටයුතු කෙරෙහි උනන්දුවක් දක්වන්නාවූ ශිෂ්‍යයින් අතර බෙහෙවින් ජනප්‍රිය වූයේය. ණය පහසුකම් ප්‍රවෘත්ති විවරණිකාවද තවත් ප්‍රකාශනයෙකි. මෙම ප්‍රකාශනයේ පළමුවැන්න කෘෂිකර්මය සඳහා ඇති ණය පහසුකම් විස්තර කළේය.

## ලේකම් දෙපාර්තමේන්තුව

වර්ෂය තුළදී ලේකම් දෙපාර්තමේන්තුව විසින් මහ බැංකු අත්පොත සඳහා සංශෝධන කිහිපයක් ඉදිරිපත් කළ අතර, ඒවා මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලදී. සේවකයනට විශාල යහපතක් සැළසෙන පරිදි අර්ථසාධක අරමුදලට කැරුන සංශෝධනයක්ද මේ අතර විය. බැංකුවේ සියලුම නීති කටයුතු පිළිබඳව ක්‍රියා කරන ලේකම් දෙපාර්තමේන්තුවේ නීති අංශය, මෙම වර්ෂය තුළදී, වෙනත් කරුණු අතර, පොදු බැංකු කටයුතු හා භාරකාර ව්‍යාපාර පනත කෙටුම්පත් කිරීමේ කාර්යයන්හිද නියුක්ත විය. වෙළෙඳ බැංකු සඳහා බලපත්‍ර ලබාදීම, වෙළෙඳ බැංකුවල ප්‍රාග්ධන අවශ්‍යතා ආදිය පිළිබඳ විධිවිධාන මෙම පනතෙහි අඩංගු වේ. වෙළෙඳ බැංකු ක්ෂේත්‍රයේ බොහෝ අංශයන් ඒකාබද්ධ කිරීමේ අරමුණින් කෙටුම්පත් කරනු ලබන මෙම නීතිය කරණ කොට ගෙන බැංකු පද්ධතියේ කාර්යභාරයන් කාර්යක්ෂම අන්දමින් හා ඵලදායී අන්දමින් ඉටු කිරීමට හැකිවනු ඇත. 1980 අංක 46 දරණ සේවක භාරකාර අරමුදල් පනතේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කිරීම සඳහාද අවශ්‍ය පියවර ගන්නා ලදී. මේ අනුව 1981 මාර්තු මස සිට ක්‍රියාත්මක වන අන්දමට මහ බැංකුව විසින් සුදුසුකම් ඇති සියලුම සේවකයින් වෙනුවෙන් දළ වැටුපින් සියයට 3 ක අනුපාතයට සේවක භාරකාර අරමුදලට දයක මුදල් ගෙවීම ආරම්භ කරන ලදී.

## කළමනාකාරිත්ව විගණන

අභ්‍යන්තර විගණන හා කළමනාකාරිත්ව සේවා අංශයන්ගෙන් සමන්විත කළමණාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව, බැංකුවේ දෙපාර්තමේන්තුවල ගිණුම් කටයුතු විගණනය කළ අතර, සේවා කටයුතු දියුණු කිරීම, ක්‍රියාමාර්ග සහ වැඩ පිළිවෙලවල් හැඩගැස්වීම, බැංකුවේ දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩල අවශ්‍යතා පිළිබඳව සමාලෝචනය කිරීම ආදී කටයුතු පිළිබඳව අධිපති විසින් දෙන ලද නියෝග අනුව, සංවිධාන සහ ක්‍රම අධ්‍යයනයක්ද බාර ගන්නා ලදී.

## මාතර ප්‍රාදේශීය කාර්යාලය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රථම ප්‍රාදේශීය කාර්යාලය 1981 මාර්තු 29 වන දින මාතරදී ගරු මුදල් හා ක්‍රම සම්පාදන ඇමති තුමා විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

ප්‍රාදේශීය කාර්යාලයේ බල ප්‍රදේශයට මාතර, හම්බන්තොට හා මොණරාගල යන පරිපාලන දිස්ත්‍රික්ක ඇතුළත් වේ.

මාතර දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් 500 ක් සඳහා වූ ස්වයං රැකියා යෝජනා ක්‍රමය හා ගම් නහා සිටුවීමේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම, ප්‍රාදේශීය කාර්යාලයේ කටයුතු ආරම්භ කිරීමත් සමගම කාර්යාලයට පැවරුණ ප්‍රධානතම කාර්යයන් විය. ස්වයං රැකියා යෝජනා ක්‍රමය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සර්ව ජන ඡන්දයේ ස්වර්ණ ජයන්තිය සැමරීම් වස් මාතර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීමට සකස් කරන ලද්දකි. ගම් නහා සිටුවීමේ යෝජනා ක්‍රමය වනාහි මාතර දිස්ත්‍රික්කයේ නොදියුණු ගම් තෝරා ඒවායේ සංවර්ධන කටයුතු කෙරෙහි රාජ්‍ය වාණිජ බැංකු (ලංකා බැංකුව හා මහජන බැංකුව) යොමු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළියෙල කරන ලද යෝජනා ක්‍රමයකි. එකී යෝජනා ක්‍රමය දැනට මාතර දිස්ත්‍රික්කයේ රදම් පොළ හා උඩ අපරැක්ක යන ගම්මාන දෙකෙහි අත්හදා බැලීමේ පදනමක් මත ක්‍රියාත්මක කරනු ලැබේ.

ප්‍රදේශයෙන් ලබා ගත හැකි අමුද්‍රව්‍ය හා ශිල්පීය ඥානය ප්‍රයෝජනයට ගෙන දියුණු කළ හැකි විවිධ ව්‍යාපෘති සඳහා බැංකු ණය හා වෙනත් සම්බන්ධීකරණ සේවා සැපයීමෙන් රැකියා විරහිත බව නැති කිරීම හා ගැමි ආදායම් මට්ටම් ඉහල තත්ත්වයකට නහා සිටුවීම එකී යෝජනා ක්‍රමවල පරමාර්ථයන් වන්නේය. සම්මන්ත්‍රණ හා රැස්වීම් මාලාවක් පැවැත්වීමෙන් යෝජනා ක්‍රම දෙක ප්‍රදේශයෙහි දේශපාලන බලධාරීනට, බැංකු කරුවනට, සංවර්ධන කටයුතු වල නියැලී සිටින රජයේ ආයතන වල නිලධාරීනට සහ මහජනයාට හඳුන්වා දෙන ලදී.

ස්වයං රැකියා හා ගම් නහා සිටුවීමේ යෝජනා ක්‍රම මාතර දිස්ත්‍රික්කයට හඳුන්වා දීමෙන් පසු එකී යෝජනා ක්‍රමවලට සහභාගී වීමට කැමැත්ත දක්වූ රැකියා විරහිත තරුණ තරුණියන් ගෙන් ඉල්ලුම්පත් රාශියක්, එකී වෙළෙඳ බැංකු දෙක මගින් ප්‍රාදේශීය කාර්යාලයට ලැබිණි. කෘෂිකර්මය, කිරිපට්ටි පාලනය, කුකුළන් ඇතිකිරීම, එළුවන් ඇතිකිරීම, ධීවර කර්මාන්තය, රසකැවිලි නිෂ්පාදනය, බීඩි නිෂ්පාදනය, අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය, මැහුම් කර්මාන්තය, වඩු කර්මාන්තය, උළු සහ ගඩොල් නිෂ්පාදනය, කොහු කර්මාන්තය හා අළුත්වැඩියා සහ නඩත්තු කිරීමේ වැඩ පොළවල් යනාදිය මූල්‍ය පහසුකම් සඳහා ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා අතර විය.

ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කළ ව්‍යවසායකයන්ට අවශ්‍ය මූලික පුහුණුව ලබා දීම සඳහා අයදුම්කරුවන් තෝරා ගැනීම 1981 මැයි මස වන විට අවසන් වූ අතර එම අයදුම්කරුවන් සඳහා ජුනි/ජුලි මාස දෙක තුළ කණ්ඩායම් වශයෙන් එක්දින පුහුණුවීමේ පාඨමාලා පවත්වන ලදී. උළු ගඩොල් කර්මාන්තය, කිරි පට්ටි පාලනය, කුකුළන් ඇතිකිරීම, හා කොහු කර්මාන්තය සඳහා මෙම පාඨමාලා පවත්වන ලදී. වෙනත් විවිධ අංශ සඳහා ඉදිරිපත් වූවන් වෙනුවෙන් සම්මන්ත්‍රණ හා සාකච්ඡා මාර්ගයෙන් එම ව්‍යාපෘති වලට අදාළ බැංකු සහ ආර්ථික කටයුතු පිළිබඳ අවබෝධයක් ලබා දීමට කටයුතු කරන ලදී. මෙම කාර්යයන්හිදී වාණිජ බැංකු හා රජයේ දෙපාර්තමේන්තු සහ ආයතන වල සහාය ප්‍රාදේශීය කාර්යාලයට ලැබිණ.

යෝජනා ක්‍රම දෙක යටතේ මූල්‍ය පහසුකම් සපයනු ලබන සෑම ව්‍යාපෘතියකම ආයෝජනය කළ යුතු උපරිම මුදල රු. 6000 නො ඉක්මවිය යුතුය. එකී මුදලින් සියයට 10 ක් හෙවත් රු: 600 ක් ව්‍යවසායකයා විසින් සැපයිය යුතුය. වාණිජ බැංකු ණය උපරිමය රු: 5400 කට සීමා වන්නේය. බැංකු ණය සඳහා අය කරනුයේ සියයට 12½ ක පොළී අනුපාතයකි. එසේ දෙනු ලබන ණය සඳහා සියයට 8½ ක පොළී අනුපාතයක් මත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ බැංකු වලට ප්‍රතිමූල්‍ය පහසුකම් සපයනු ලැබේ.

1981 දෙසැම්බර් මස අවසන් වන විට ස්වයං රැකියා යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපෘති යෝජනා 263 ක් ද ගම් නගා සිටුවීමේ ක්‍රමය යටතේ ව්‍යාපෘති යෝජනා 27 ක්ද ණය පහසුකම් සඳහා නිර්දේශ කර වාණිජ බැංකු වෙත යොමු කරන ලදී. එසේ නිර්දේශ කරන ලද ණය මුදල් වල එකතුව පිළිවෙලින් රු: 985,955 ක් සහ රු: 80,096 ක් විය. නිර්දේශිත ණය මුදල් පිළිබඳ ව්‍යාපෘති සහ බැංකු අනුව කරන ලද වර්ගීකරණයක් 2.17 සංඛ්‍යා සටහනෙහි ඇතුළත් වේ.

## 2·17 සංඛ්‍යා සටහන

## ස්වයං රැකියා හා ගම් නඟා සිටුවීමේ යෝජනා ක්‍රම යටතේ ප්‍රාදේශීය කාර්යාලය විසින් නිර්දේශ කරන ලද ණය මුදල්

| ව්‍යාපෘතිය | ස්වයං රැකියා යෝජනා ක්‍රමය | | ගම් නඟා සිටුවීමේ යෝජනා ක්‍රමය (රදම්පොළ හා උඩඅපරැක්ක) | |
|---|---|---|---|---|
| | ණය මුදල් සංඛ්‍යාව | ණය මුදල් ප්‍රමාණය රුපියල් | ණය මුදල් සංඛ්‍යාව | ණය මුදල් ප්‍රමාණය රුපියල් |
| **ලංකා බැංකුව** | | | | |
| 1· කෘෂිකර්මය | 1 | 5,000 | 2 | 3,000 |
| 2· කිරිපට්ටි පාලනය | 11 | 44,200 | 2 | 10,800 |
| 3· කුකුළන් ඇතිකිරීම | 2 | 10,400 | 1 | 2,900 |
| 4· ධීවර කර්මාන්තය | 3 | 13,450 | — | — |
| 5· රසකැවිලි නිෂ්පාදනය | 6 | 26,720 | 2 | 7,120 |
| 6· බීඩි නිෂ්පාදනය | 5 | 22,890 | — | — |
| 7· අත්යන්ත්‍ර පේෂකර්මාන්තය | 1 | 3,000 | 4 | 12,500 |
| 8· මැහුම් කර්මාන්තය | 9 | 37,180 | — | — |
| 9· වඩු කර්මාන්තය | 2 | 4,250 | — | — |
| 10· කඩදසි නිෂ්පාදනය | 3 | 13,490 | — | — |
| 11· උළු හා ගඩොල් | 23 | 96,530 | 4 | 16,575 |
| 12· කළුගල් කැඩීම | 1 | 3,000 | 1 | 1,471 |
| 13· කොහු කර්මාන්තය | 6 | 18,340 | 4 | 6,610 |
| 14· අළුත්වැඩියා හා නඩත්තු කිරීමේ වැඩපොළවල් | 3 | 12,845 | — | — |
| 15· අනෙකුත් | 8 | 30,330 | — | — |
| උප එකතුව | 84 | 341,625 | 20 | 60,976 |
| **මහජන බැංකුව** | | | | |
| 1· කෘෂිකර්මය | 7 | 16,565 | — | — |
| 2· කිරිපට්ටි පාලනය | 16 | 59,200 | — | — |
| 3· කුකුළන් ඇතිකිරීම | 7 | 34,450 | — | — |
| 4· එළුවන් ඇතිකිරීම | 2 | 4,250 | — | — |
| 5· රසකැවිලි නිෂ්පාදන | 14 | 56,115 | — | — |
| 6· බීඩි නිෂ්පාදනය | 1 | 4,185 | — | — |
| 7· අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය | 3 | 9,550 | — | — |
| 8· මැහුම් කර්මාන්තය | 18 | 58,685 | — | — |
| 9· වඩු කර්මාන්තය | 19 | 53,520 | — | — |
| 10· උළු සහ ගඩොල් නිෂ්පාදනය | 53 | 2,14,615 | 1 | 2,000 |
| 11· කළුගල් කැඩීම | 8 | 32,440 | 1 | 4,000 |
| 12· කොහු කර්මාන්තය | 11 | 23,425 | 3 | 5,600 |
| 13· අළුත් වැඩියා හා නඩත්තු වැඩ පොළවල් | 9 | 38,480 | — | — |
| 14· කඩදසි නිෂ්පාදනය | — | — | 1 | 5,400 |
| 15· අනෙකුත් | 1 | 38,850 | 1 | 2,120 |
| | 179 | 6,44,330 | 7 | 19,120 |
| මුළු එකතුව | 263 | 9,85,955 | 27 | 80,096 |

1981 දෙසැම්බර් මස අවසානයේදී ලංකා බැංකුව සහ මහජන බැංකුව අනුමත කර තිබූ ණය මුදල් සංඛ්‍යාව හා ප්‍රමාණය 2.18 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

## 2 · 18 සංඛ්‍යා සටහන

## ස්වයං රැකියා හා ගම් නඟා සිටුවීමේ යෝජනා ක්‍රම යටතේ වාණිජ බැංකු විසින් 1981 දෙසැම්බර් මස 31 වෙනි දිනට අනුමත කරන ලද ණය.

| යෝජනා ක්‍රමය | ලංකා බැංකුව | | මහජන බැංකුව | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | මුදල රුපියල් | සංඛ්‍යාව | මුදල රුපියල් |
| ස්වයං රැකියා යෝජනාක්‍රමය .. | 14 | 60,535 | 16 | 58,255 |
| ගම් නඟා සිටුවීමේ යෝජනා ක්‍රමය (රදම්පොළ සහ උඩ අපරැක්ක) .. | 5 | 9,500 | 3 | 6,370 |
| | 19 | 70,035 | 19 | 64,625 |

ස්වයං රැකියා හා ගම් නගා සිටුවීමේ යෝජනා ක්‍රම මොණරාගල දිස්ත්‍රික්කය තුළ ද හඳුන්වා දීමට කටයුතු කර ගෙන යනු ලැබේ.

**සම්ප්‍රදායික බැංකු කටයුතු**

මාතර දිස්ත්‍රික්කය තුළ බැංකු චෙක්පත් කඩිනමින් නිෂ්කාශනය වීම පහසු කිරීම් වස් ප්‍රාදේශීය නිෂ්කාශනාගාරයක් 1981 ජූනි 15 වැනි දින ප්‍රාදේශීය කාර්යාලයේ දී ආරම්භ කරන ලදී. දිනට නිෂ්කාශන දෙකක් පැවැත්වේ. පළමු නිෂ්කාශණය පෙ. ව. 11.30 ට පැවැත්වෙන අතර පියවුම් නිෂ්කාශනය පසුදින පෙ. ව. 8.30 ට පැවැත්වේ.

ලංකා බැංකුව, මහජන බැංකුව හා සීමාසහිත වාණිජ බැංකුව නිෂ්කාශනයට සහභාගි වෙති.

## කාර්ය මණ්ඩල පුවත්

1981 වර්ෂය තුළදී අධිපති, ආචාර්ය ඩබ්ලිව්. රාසපුත්‍රම් පහත සඳහන් සමුළු රැස්වීම් සහ සම්මන්ත්‍රණවලට සහභාගි විය.

(අ) ලිබර්විල් (ගැබොන්) හි පවත්වන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ අතුරු කමිටුවේ සහ ඒකාබද්ධ සංවර්ධන කමිටුවේ රැස්වීම් (මැයි 11—24).

(ආ) ලන්ඩනයේ පවත්වන ලද, පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල මහ බැංකු අධිපති වරුන්ගේ වාර්ෂික රැස්වීම සහ බැස්ලේහි පවත්වන ලද ජාත්‍යන්තර බැංකුවේ වාර්ෂික රැස්වීම හා ඉන් අනතුරුව, නිල සාකච්ඡා සඳහා කයිරෝහි, ඊජිප්තු මහ බැංකුවට සහ අබුඩාබි හි එක්සත් අරාබි එමීර් රාජ්‍ය බැංකුවට යාම (ජූනි 9 — 25).

(ඇ) සිඩ්නි හි පවත්වන ලද ආයෝජන දිරි ගැන්වීමේ සම්මන්ත්‍රණ සහ බැංකොක් සහ මැනිලාහි පවත්වන ලද නිල සාකච්ඡා (අගෝස්තු 27 — සැප්තැම්බර් 10)

(ඈ) වොෂිංටන් ඩී. සී. හි පවත්වන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ වාර්ෂික රැස්වීම. (සැප්තැම්බර් 19 — ඔක්තෝබර් 19).

(ඉ) සිංගප්පූරුවේ පවත්වන ලද මහ බැංකු අධිපති වරුන්ගේ 14 වැනි සියැන්සා සමුළුව සහ බීජිං හි පැවැත්වුන නිල සාකච්ඡා (නොවැම්බර් 17 — 30).

අධිපති දිවයිනෙන් බැහැරව ගොස් සිටි කාලසීමාවන් තුළදී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති, ආචාර්ය එච්. එන්. එස්. කරුණාතිලක බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කටයුතු කළේය.

අධිපති සහ ආචාර්ය එච්. එන්. එස්. කරුණාතිලක දිවයිනෙන් බැහැරව සිටි 1981 නොවැම්බර් 17 වැනි දින සිට 30 වැනි දින දක්වා කාලසීමාව තුළදී, නියෝජ්‍ය අධිපති කේ. කනගසබාපති මහතා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ලෙස නම් කරන ලදුව, බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කටයුතු කළේය.

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් දිවයිනෙන් බැහැරව සිටි කාලසීමාවන් තුළදී, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් සී. පී. චන්මුගම් මහතා මුදල් මණ්ඩලයේ නිළ සාමාජිකයා වශයෙන් කටයුතු කළේය.

ජේ. එස්. ජයවර්ධන මහතා, අධිපතිගේ සහකාර වශයෙන් ඔහුගේ කටයුතුවලට අමතරව, 1981 ජූනි 8 වැනි දින සිට අගෝස්තු 8 වැනි දින දක්වා කාලසීමාව තුළ ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන්ද කටයුතු කළේය.

**පත් කිරීම්**

බංග්ලාදේශය, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වෛකල්පිත විධායක අධ්‍යක්ෂ ලෙස සේවයේ නිරතව සිටි, අධිපතිගේ සහකාර ඩී. එල්. කන්නන්ගර මහතා නැවත මහ බැංකුවේ වැඩ බාර ගන්නා ලදුව, 1981 දෙසැම්බර් 1 වැනි දින සිට නියෝජ්‍ය අධිපති ලෙස පත් කරනු ලැබීය.

සංඛ්‍යාන අධ්‍යක්ෂ ආචාර්ය කේ. එස්. ඊ. ජයතිලක 1981 ජුනි 1 වැනි දින සිට විධායක අධ්‍යක්ෂ ලෙස පත් කරනු ලැබීය.

එක්සත් රාජධානියේ පුහුණුවක් සඳහා විශේෂ නිවාඩු ලබා සිටි එස්. ඩබ්ලිව්. පී. අමරසූරිය මහතා නැවත මහ බැංකුවේ වැඩ බාර ගන්නා ලදුව, 1981 ජුනි 1 වැනි දින සිට බැංකු සංවර්ධන හා පුහුණුකිරීම් උපදේශක ලෙස පත් කරනු ලැබීය.

ගැම්බියාවේ මහ බැංකුවේ තනතුරක් බාර ගනු පිණිස ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට මුදා හැර සිටි වැඩ බලන අතිරේක ප්‍රධාන ගණකාධිකාරී එච්. ප්‍රේමරත්න මහතා 1981 පෙබරවාරි 25 වැනි දින නැවත මහ බැංකුවේ වැඩ බාර ගත්තේය. 1981 මැයි 1 වැනි දින සිට ඔහු ප්‍රධාන ගණකාධිකාරී වශයෙන් පත් කරනු ලැබීය.

පරිශ්‍ර අධ්‍යක්ෂ එස්. පී. වික්‍රමරත්න මහතා 1981 ජුනි 1 වැනි දින සිට ව්‍යවහාර මුදල් අධිකාරී වශයෙන් පත් කරනු ලැබීය.

ග්‍රාමීය ණය හා සංවර්ධන මුදල් අධ්‍යක්ෂ එස්. ඊස්පරදසන් මහතා, 1981 ජුනි 8 වැනි දින සිට පූර්ණ කාලීන පදනමක් මත මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට මුදා හරින ලදී. 1981 අගෝස්තු 8 වැනි දින ඔහු නැවත මහ බැංකුවේ වැඩ බාර ගන්නා ලදුව, එදින සිට ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරනු ලැබීය.

ආයතන අධ්‍යක්ෂ, ඩී. කේ. ජයවර්ධන මහතා 1981 දෙසැම්බර් 1 වැනි දින සිට සේවක අර්ථ සාධක අරමුදල් අධිකාරී වශයෙන් පත් කරනු ලැබීය.

පී. එම්. නාගහවත්ත මහතා 1981 ජනවාරි 1 වැනි දින සිට වැඩ බලන පරිශ්‍ර අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

එන්. ඒ. ධර්මබන්ධු මහතා 1981 අගෝස්තු 1 වැනි දින සිට වැඩ බලන අතිරේක ප්‍රධාන ගණකාධිකාරී වශයෙන් පත් කරන ලදී.

ජී. එම්. පී. ඩී. ද සිල්වා මහතා, 1981 ජුනි 8 වැනි දින සිට වැඩ බලන ග්‍රාමීය ණය සහ සංවර්ධන මුදල් අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදුව, 1981 දෙසැම්බර් 1 වැනි දින සිට, වැඩ බලන ග්‍රාමීය ණය අධ්‍යක්ෂ වශයෙන් පත් කරනු ලැබීය.

එච්. එම්. ආර්. ඇල්ලෙපොළ මහතා, 1981 අගෝස්තු 1 වැනි දින සිට, වැඩ බලන අතිරේක ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදුව, 1981 දෙසැම්බර් 1 වැනි දින සිට වැඩ බලන සංවර්ධන මුදල් අධ්‍යක්ෂ වශයෙන් පත් කරනු ලැබීය.

පී. අමරසිංහ මහතා 1981 ජුනි 8 වැනි දින සිට වැඩ බලන රාජ්‍ය ණය අධිකාරී ලෙස පත් කරනු ලැබීය.

අර්ථ සාධක අරමුදල් අධිකාරී සහ දත්ත සැකසුම් කළමනාකරු වී. එන්. ඩී. නානායක්කාර මහතා, 1981 දෙසැම්බර් 1 වැනි දින සිට දත්ත සැකසුම් දෙපාර්තමේන්තුවේ කළමනාකරු වශයෙන් පත් කරනු ලැබීය.

ආචාර්ය ජී. එම්. අබයරත්න 1981 අගෝස්තු 1 වැනි දින සිට ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ වැඩබලන අධ්‍යක්ෂ ලෙස පත් කරනු ලැබීය.

බී. එෆ්. ජේ. සිල්වා මහතා 1981 දෙසැම්බර් 1 වැනි දින සිට වැඩ බලන ආයතන අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

**විශ්‍රාම ගැනීම්**

අධිපතිගේ සහකාර ඩී. ආර්. සිරිවර්ධන මහතා, 1981 ජුලි 29 වැනි දින සිට බැංකු සේවා වෙන් විශ්‍රාම ගනු ලැබීය.

විශේෂ උපදේශක එන්. කදිර්ගාමතම්බි මහතා, 1981 ජනවාරි 4 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගනු ලැබීය.

ආහාර කොමසාරිස් වශයෙන් කටයුතු කරනු පිණිස, ආහාර හා සමූපකාර අමාත්‍යාංශයට මුදු හැර සිටි පී. එම්. හසන් මහතා, 1981 මැයි 1 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගනු ලැබීය.

**බැංකු සේවාවෙන් මුදු හරිනු ලැබ සිටින නිලධාරීන් (1981 දෙසැම්බර් 31 වැනි දිනට)**

පහත නම් සඳහන් බැංකු නිලධාරිහු, ශ්‍රී ලංකාවේ අමාත්‍යාංශවලට, රජයේ දෙපාර්තමේන්තුවලට සහ රාජ්‍ය සංස්ථාවලට සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තනතුරුවලට මුදු හරිනු ලැබ සිටියහ.

අධිපතිගේ සහකාර ටී. ජී. පුංචිඅප්පුහාමි මහතා, 1981.10.31 වැනි දින තෙක්, අර්ධ කාලීන වශයෙන් තවදුරටත් රාජ්‍ය මැණික් සංස්ථාව වෙත.

ඩී. කේ. වික්‍රමසිංහ මහතා, ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවේ සාමාන්‍යාධිකාරී වශයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

අධිපතිගේ සහකාර ඒ. එස්. ජයවර්ධන මහතා, බංග්ලාදේශයේ, ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ වෛකල්පිත විධායක අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කරනු පිණිස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

වී. එස්. සුබ්‍රමානියම් මහතා, සොලමන් දිවයින්වල මුදල් අධිකාරියේ උපදේශක වශයෙන් කටයුතු කරනු පිණිස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

ප්‍රධාන ගණකාධිකාරී යූ. ඒ. ද සිල්වා මහතා, ගැම්බියාවේ මහ බැංකුවට සේවය කරනු සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

ආචාර්ය කේ. එස්. ඊ. ජයතිලක ඕමාන්හි මහ බැංකුවේ උපදේශක වශයෙන් සේවය කරනු පිණිස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

ආචාර්ය එස්. ටී. ජී. ප්‍රනාන්දු මහජන බැංකුවේ සභාපති වශයෙන් කටයුතු කරනු පිණිස, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

ආර්. එම්. තෙන්නකෝන් මහතා, එස්ටේට් ප්‍රොඩක්ට්ස් ලිමිටඩ්හි සභාපති වශයෙන් කටයුතු කරනු පිණිස, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත.

එස්. රාජලිංගම් මහතා, මහ භාණ්ඩාගාරයේ, ආර්ථික කටයුතු අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කරනු පිණිස මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

ආචාර්ය එල්. ඊ. එන්. ප්‍රනාන්දු, මහ භාණ්ඩාගාරයේ අතිරේක ආර්ථික කටයුතු අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කරනු පිණිස මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

ආචාර්ය ජී. ඩබ්ලිව්. පී. වික්‍රමසිංහ, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂ වශයෙන් වෙළඳ හා නාවුක කටයුතු අමාත්‍යාංශය වෙත.

ඒ. ඒ. ඩී. ජස්ටින් මහතා, ශ්‍රී ලංකා ටයර් සංස්ථාවේ සභාපති සහ කර්මාන්ත සහ විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් කටයුතු කරනු පිණිස, කර්මාන්ත සහ විද්‍යා කටයුතු අමාත්‍යාංශය වෙත.

සී. ඊ. ජයසූරිය මහතා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව වෙත.

ආචාර්ය ඒ. සී. රන්දෙණි, එම්. බී. දිසානායක සහ ජී. ඒ. වී. පොන්සේකා යන මහත්වරුන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

ඩී. ජේ. එම්. මීගොඩ සහ ඒ. ඒ. ආර්. දිසානායක යන මහත්වරුන් ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවට සේවය කරනු පිණිස මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.